The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | න්‍යාය | ඉතිහාසය| පන්ති අරගල

## ජෙන්-Z නැගිටීම් සහ නායකත්වයේ අර්බුදය: ‘නායකත්වයක් නොමැති’ ව්‍යාපාර සහ ‘වාම ජනතාවාදයට’ එරෙහිව නොනවතින විප්ලවය

නැගිටීම ඇති කළ විප්ලවීය අනතුරට සමානුපාතික පැහැදිලිතාවයකින් ව්‍යාජ-වාම සංවිධාන සහ වෘත්තීය සමිති නිලධරයෝ තම කාර්යය තේරුම් ගත්හ. ඔවුන්ගේ තීරණාත්මක කාර්යය වූයේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම නොව එය පාලනය කිරීමයි. පි.17

## “මහා ඊශ්‍රායලය” න්‍යාය පත්‍රය හඹා යාම සඳහා නෙතන්යාහු ඉරාන යුද්ධය භාවිතා කරයි

අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ අන්ත දක්ෂිණාංශික රජය, ලෙබනන්, පලස්තීන සහ ඉරාන යන සියලු ප්‍රතිරෝධයන් තලා දමමින්, මහා ඊශ්‍රායලයක් ස්ථාපිත කිරීම සඳහා ඉරානයට එරෙහි එක්සත් ජනපද-ඊශ්‍රායල යුද්ධය භාවිතා කරමින් සිටී. පි.8

## ඉරානයට එරෙහි යුද්ධය පන්ති අරගලය තීව්‍ර කරනු ඇත

ආරම්භ වී ඇති ගැටුමේ ආරම්භක අවධීන්හි ප්‍රතිඵලය කුමක් වුවත්, ඇමරිකානු අධිරාජ්‍යවාදයට ව්‍යසනය මුනගැසෙනු ඇත. එයට ලෝකය ජය ගත නොහැක. එයට මැද පෙරදිග ජනතාව මත යටත් විජිත විලංගු නැවත පැටවිය නොහැක. පි.11

## කියුබාව යටත් කරගැනීම සඳහා එක්සත් ජනපදය කුසගින්න යොදා ගැනීමට උත්සාහ කරන විට එරට සන්නද්ධ ප්‍රකෝප කිරීම ව්‍යර්ථ කරයි පි.14



# ට්‍රම්ප් සහ හෙග්සෙත් ඉරානයට එරෙහිව “පූර්ණ යුද්ධය” දියත් කරති

එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය ඉරානයට එරෙහිව නීති විරෝධී සහ ප්‍රකෝප නොකළාවූ යුද්ධයක් දියත් කිරීමෙන් ගත වූ දින තුන තුළ, ප්‍රහාරයේ ස්වභාවය පැහැදිලි වී ඇත: එය ඉරාන රාජ්‍යය ක්‍රමානුකූලව විනාශ කිරීම සහ සමස්ත ජනගහනයක්ම යටත් කර ගැනීම අරමුණු කරගත් දැවැන්ත බෝම්බ ප්‍රහාරයකි. පි.2



## ඇමරිකානු අධිරාජ්‍යවාදයේ සමූලඝාතක යුද්ධය මැද ඉරානය සිදු කරන ආත්මාරක්ෂක ප්‍රහාර එක්සත් ජාතීන්ගේ සංවිධානය හෙළා දකී

ෆැසිස්ට්වාදී ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ නායකත්වයෙන් යුත් එක්සත් ජනපදය පෙබරවාරි 28 වන දින ඓතිහාසිකව පීඩිත රටක් වන ඉරානයට එරෙහිව ප්‍රකෝප නොකෙරුණු ආක්‍රමණශීලී යුද්ධයක් දියත් කළ බව යෝජනාවේ සඳහන් නොවීය. පි.5

# ට්‍රම්ප් සහ හෙග්සෙත් ඉරානයට එරෙහිව "පූර්ණ යුද්ධය" දියත් කරති

**WSWS කර්තෘ මණ්ඩලය** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *03* වන දින ***'Trump and Hegseth launch "total war" against Iran'*** යන හිසින් පළවූ *WSWS* කර්තෘ මණ්ඩලය විසින් ලියන ලද දිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය ඉරානයට එරෙහිව නීති විරෝධී සහ ප්‍රකෝප නොකළාවූ යුද්ධයක් දියත් කිරීමෙන් ගත වූ දින තුන තුළ, ප්‍රහාරයේ ස්වභාවය පැහැදිලි වී ඇත: එය ඉරාන රාජ්‍යය ක්‍රමානුකූලව විනාශ කිරීම සහ සමස්ත ජනගහනයක්ම යටත් කර ගැනීම අරමුණු කරගත් දැවැන්ත බෝම්බ ප්‍රහාරයකි.



2026 මාර්තු 1 වන ඉරිදා ඉරානයේ ටෙහෙරානයේ ඇමරිකානු-ඊශ්‍රායල ප්‍රහාරයකින් පසු දුම් වළාවක් නැගී එන ආකාරය වහලයක සිට ජනතාව නරඹති. [AP ඡායාරූපය/වහීඩ් සලේමි]

වාර්තාවලින් පෙනී යන්නේ පළමු පැය 48 තුළ පමණක්, එක්සත් ජනපද සහ ඊශ්‍රායල හමුදා රාත්තල් 2,000 ක බෝම්බ භාවිතා කරමින් ජ්‍යෙෂ්ඨ දේශපාලන හා හමුදා නායකයින් ඝාතනය කිරීම සඳහා බෙලි කැපීමේ ප්‍රහාර එල්ල කරමින් ඉලක්ක 1,200 කට පමණ ප්‍රහාර එල්ල කළ බවයි. බෝම්බ ප්‍රහාරය ඉරානයේ ගුවන් ආරක්ෂක සහ රටේ මූලික ස්නායු පද්ධතිය—ගුවන් යානා නාශක අවි, රේඩාර්, සන්නිවේදන ජාල සහ අණ දෙන සහ පාලන පද්ධති—අක්‍රීය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත්තේ ඊටත් වඩා විනාශකාරී ප්‍රහාරයකට සූදානම් වීම සඳහා ය.

ඉරානයේ මානව හිමිකම් ක්‍රියාකාරීන් (HRANA) ට අනුව, නැගෙනහිර වේලාවෙන් (Eastern Time) සඳුදා දහවල් වන විට, ළමුන් 176 දෙනෙකු ඇතුළුව අවම වශයෙන් සිවිල් වැසියන් 742 දෙනෙකු මරා දමා ඇති අතර, 900 කට වැඩි පිරිසක් තුවාල ලබා ඇත.

ට්‍රම්ප් මෙම සංහාරය ගැන ප්‍රීති වී ඇත. "අපි ඔවුන්ට දුවන්න පහර දෙනවා," ඔහු කේබල් රූපවාහිනී නිවේදකයෙකුට පැවසුවේ, ඉදිරියේදී සිදුවීමට නියමිතව ඇති විශාල ඝාතනයක් පිළිබඳ පැහැදිලි තර්ජනයක් නිකුත් කරමිනි: "අපි ඔවුන්ට තදින් පහර දීමට පටන් ගෙනවත් නැහැ. … ලොකු දේ ඉක්මනින්ම එනවා." යුද්ධය "සති හතරක් හෝ පහක්" සහ සමහර විට "බොහෝ කාලයක්" පැවතිය හැකි බව ට්‍රම්ප් ප්‍රකාශ කර තිබේ. සඳුදා රාත්‍රියේ අග භාගයේ සමාජ මාධ්‍ය සටහනක දී ට්‍රම්ප් ප්‍රකාශ කළේ, එක්සත් ජනපද අවි තොග සමග "යුද්ධ 'සදහටම' කළ හැකි" බවයි.

අන්ත දක්ෂිණාංශික නිව්යෝර්ක් පෝස්ට් පුවත්පතට කතා කරමින් ට්‍රම්ප් ප්‍රකාශ කළේ, "පාබල හමුදා ආක්‍රමණයක් සම්බන්ධයෙන් මට චකිතයක් නැත. සෑම ජනාධිපතිවරයෙක්ම පවසන්නේ, "පාබල හමුදා නොයොදවනු ඇති" බවයි. මම එසේ නොකියමි."

ට්‍රම්ප් පරිපාලනයේ උමතු ගිනි අවුලුවන්නන් සහ ඊශ්‍රායලයේ ඔවුන්ගේ සහචරයින් මුළු කලාපයම ගිනිබත් කරමින් සිටින අතර ලෝකයම විශ්මයජනක පරිමාණයේ ව්‍යසනයකට ඇද දැමීමේ තර්ජනය මතු කර ඇත.

ධවල මන්දිරය විසින් නිකුත් කරන ලද සාධාරණීකරණයන් සහ "පැහැදිලි කිරීම්" දවසින් දවස සහ පැයෙන් පැය පවා වෙනස් වේ. මෙම යුද්ධය දියත් කළේ ඇයි, එය පිළිතුරු දෙන්නේ කුමන "තර්ජනයට" ද යන්න හෝ ඔවුන් හඹා යන බව කියාපාන ප්‍රතිඵලය කුමක්ද යන්න පිළිබඳව ට්‍රම්ප් සහ ඔහුගේ සහායකයින්ට සංගත විස්තරයක් ලබා දිය නොහැක. අයතුල්ලා කමේනි ඝාතනයෙන් පසු "සංක්‍රාන්තියක්" සඳහා වූ ඔහුගේ සැලසුම් ඉරාන රාජ්‍යයේ නායකත්වයේ සියලු දෙනා මරා දැමීම නිසා කඩාකප්පල් වූ බව ට්‍රම්ප් විසින්ම පිළිගෙන තිබේ.

වොෂින්ටනය තුළ වැජඹෙන්නේ අන්ත මැර-කල්ලිවාදය යි. ප්‍රහාරය ආරම්භ වීමෙන් පසු සඳුදා උදෑසන පෙන්ටගනයේ පැවති පළමු නිල හමුදා සාකච්ඡාවේ දේශපාලන අන්තර්ගතය එයයි. යුද ලේකම් පීට් හෙග්සෙත් මෙම සාකච්ඡාව භාවිතා කරමින් මෙසේ ප්‍රකාශ කළේය: "දින දෙකකට පෙර, ජනාධිපති ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප්ගේ මග පෙන්වීම සහ සෘජු නියෝග යටතේ, යුද දෙපාර්තමේන්තුව ඉතිහාසයේ වඩාත්ම මාරාන්තික, වඩාත්ම සංකීර්ණ සහ වඩාත්ම නිරවද්‍ය ගුවන් මෙහෙයුම වන

ඔපරේෂන් එපික් ෆියුරි (Operation Epic Fury) දියත් කළේය.”

ඉතිහාසයේ “වඩාත්ම මාරාන්තික” ගුවන් මෙහෙයුම? අනුමාන වශයෙන් එය දෙවන ලෝක යුද්ධයේ ගිනි-බෝම්බ හෙලීමේ සංහාරවලට වඩා මාරාන්තික බව අදහස් කෙරෙයි. පිළිවෙලින් 90,000 ක් සහ 60,000 ක් මිය ගිය හිරෝෂිමා සහ නාගසාකි වෙත පරමාණු බෝම්බ හෙලීම ඇතුළුව අවම වශයෙන් මිනිසුන් 100,000 ක් මරා දැමූ ටෝකියෝව පුළුස්සා දැමීම මීට ඇතුලත් වේ.

එක්සත් ජනපද හමුදාව තරණය නොකරන කිසිදු රතු රේඛාවක් නොමැති බව හෙග්සෙත් පැහැදිලිව ප්‍රකාශ කළේය. යුද්ධය සිදු කරනු ඇත්තේ “සියල්ල අපගේ කොන්දේසි මත, උපරිම බලධාරීත්වය සමඟ, කිසිදු සටන් කිරීමේ තකතීරු නීති රීති නොමැතිව, ජාතිය ගොඩනැගීමේ මඩ ගොහොරුවක් නොමැතිව, ප්‍රජාතන්ත්‍රවාදය ගොඩනැගීමේ අභ්‍යාසයක් නොමැතිව, දේශපාලනිකව නිවැරදි යුද්ධ නොමැතිව බව ඔහු පුරසාරම් දෙඩවීය. අපි ජයග්‍රහණය සඳහා සටන් කරමු…”

මෙය නාසීන් කළාක් මෙන් යුද්ධ කිරීමට අදහස් කරන ප්‍රකාශයකි. නාසි ප්‍රචාරක අමාත්‍ය ජෝසප් ගොබෙල්ස් අනුකරණය කරමින් හෙග්සෙත් “සම්පූර්ණ යුද්ධය” ප්‍රකාශ කරයි: එක්සත් ජනපදය ජාත්‍යන්තර හෝ දේශීය නීතියෙන් සීමා නොවනු ඇත. තුන්වන රයිකයට එරෙහිව විනිශ්චය කිරීමේදී නියුරම්බර්ග් විනිශ්චය සභාව හෙළා දුටුවේ මෙයයි: එනම්, ආක්‍රමණශීලී යුද්ධය දියත් කිරීම “සාමයට එරෙහි අපරාධයක්”—එනම්, “ඉහළම ජාත්‍යන්තර අපරාධය”—ලෙස තීන්දු කිරීමයි. අවසානයේ ඊට වගකිවයුත්තන් මරණ දණ්ඩනයට ලක් කෙරුණි.

ලේ ඉල්ලා හඬ නගමින් හෙග්සෙත් “රණශූර ආචාර ධර්ම” වර්ණනා කරමින් මෙසේ පැවසීය: “අපි තවදුරටත් ආරක්ෂකයින් නොවෙමු. අපි රණශූරයන් වෙමු, සතුරා මරා දැමීමට සහ ඔවුන්ගේ අධිෂ්ඨානය බිඳ දැමීමට අප පුහුණු කර ඇත.” එක් අවස්ථාවක, හෙග්සෙත් ඊශ්‍රායලය “දක්ෂ හවුල්කරුවන් ලෙස ප්‍රශංසා කළේය… අපගේ බොහෝ සාම්ප්‍රදායික සහචරයින් මෙන්, තම දෑත් අඹරවමින් බලය භාවිතා කිරීම ගැන අනිශ්චිතව පසුබට වෙමින් හා වික්ෂිප්ත වෙමින්” සිටින්නේ නැත . එනම්, ගාසා තීරයේ ඊශ්‍රායල ජන සංහාරය ඉරානය සඳහා ද ආදර්ශයක් විය යුතුය.

මුළු සාකච්ඡාවේම තර්ජනාත්මක ස්වරයක් තිබුණි: නීති විරෝධී යුද්ධයක් දියත් කර සමූහ ඝාතනයක් සූදානම් කරන පාලන තන්ත්‍රයක් ඒ සමඟම ප්‍රකාශ කරන්නේ ඇමරිකානු ජනතාවට කිසිදු පැහැදිලි කිරීමක් කළ යුතු නැති බවත් කිසිදු ප්‍රශ්න කිරීමක් නොඉවසන බවත්ය. බෝම්බ ප්‍රහාරය “සති හතරක් හෝ පහක්” පවතිනු ඇති බවට ට්‍රම්ප් කළ ප්‍රකාශය වාර්තාකරුවෙකු උපුටා දැක්වූ විට, එය “උගුල් ප්‍රශ්නයක්” (gotcha question) බව කියමින් හෙග්සෙත්ර් එය සමච්චලයට ලක් කළේය. ට්‍රම්ප් කලින් තමාගේම “සදාචාරය” ලෙස විස්තර කළ දෙය හැර වෙනත් කිසිදු බාධාවක් ධවල මන්දිරය සහ පෙන්ටගනය හඳුනා නොගනී.

ඉරානය නටාන්ස් න්‍යෂ්ටික සුපෝෂණ ආයතනය (nuclear enrichment facility) ප්‍රහාරවලට ලක් වූ බවට චෝදනා කිරීමෙන් පසු මාර්තු 2 වන දින ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA) හදිසි පාලක මණ්ඩල සැසියක් කැඳවීය. න්‍යෂ්ටික ස්ථානවලට එල්ල වන ප්‍රහාර දිගටම පැවතුනහොත්, “ප්‍රධාන නගරවලට වඩා විශාල ප්‍රදේශවලින් හෝ ප්‍රධාන නගර වලින් ජනතාව ඉවත් කිරීමේ අවශ්‍යතාවය ඇතුළු බරපතල ප්‍රතිවිපාක සහිත විය හැකි විකිරණශීලී මුදා හැරීමක් අපට බැහැර කළ නොහැකි” බව අධ්‍යක්ෂ ජෙනරාල් රෆායෙල් ග්‍රෝසි ( Rafael Grossi) සිය ප්‍රකාශයෙන් අනතුරු ඇඟවීය.

හෙග්සෙත්ගේ ප්‍රකාශයන් උත්සන්න කිරීමේ ඊළඟ අදියරද පෙන්නුම් කළේය. “ හමුදා විදෙස් භූමියක මැදිහත් කිරීම” ප්‍රතික්ෂේප කිරීම බැහැර කරනා අතර, ට්‍රම්ප්ගේම ප්‍රකාශයන් ප්‍රතිරාවය කරමින් ඔහු, එක්සත් ජනපදය ප්‍රමුඛ ආක්‍රමණයක–එනම්, දළ වශයෙන් මිලියන 93 ක ජනතාවක් සිටින රටකට එරෙහිව පූර්ණ පරිමාණයේ ගොඩ බිම් යුද්ධයක–අපේක්ෂාව විවෘතව තැබීය.

2003 ඉරාක ආක්‍රමණය ආරම්භ වූයේ ඇමරිකානු හමුදා භටයින් 145,000 ක් පමණ සමඟින් වන අතර, එක්සත් ජනපද නිලධාරීන් විස්තර කළේ එය “ඉරානය ආක්‍රමණය කිරීමට අවශ්‍ය වන ප්‍රමාණයෙන් සුළු කොටසක්” ලෙසයි. ඉරානය ඉරාකයට වඩා විශාල, කඳුකර සහ ජනාකීර්ණ වන අතර දිගුකාලීන ප්‍රතිරෝධයක් දැක්වීමට බෙහෙවින් හැකියාව ඇත. භූමි අත්පත් කර ගැනීමෙන් පාලන තන්ත්‍ර වෙනසක් කිරීමට ගන්නා ඕනෑම උත්සාහයක්, ඕනෑම බැරෑරුම් තක්සේරුවකට අනුව, ආරම්භයේදීම ලක්ෂ කිහිපයක හමුදා ද, වාඩිලා ගැනීම සහ අභ්‍යන්තර පාලනය සදහා බෙහෙවින් විශාල හමුදාවන්ද ඉල්ලා සිටිනු ඇත.

ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මූලෝපාඥයන්ගේ සම්මත කැරලි මර්දන සහ වාඩිලාගැනීමේ සැලසුම්කරණය, පදිංචිකරුවන් 1,000 කට ආසන්න වශයෙන් ආරක්ෂක නිලධාරීන් 20-25 ක මිණුම් ලකුණක් භාවිතා කරයි; ඉරානයේ ජනගහනයට අදාළ වන පරිදි, එයින් අදහස් කරන්නේ දළ වශයෙන් මිලියන 1.9 ත් 2.3 ත් අතර හමුදා එහි යෙදිය යුතු බවයි.

ඇමරිකානු සමාජය යුද්ධයට සම්පූර්ණයෙන්ම යටත් නොකර මෙම පරිමාණයේ යුද්ධයක් කළ නොහැකිය. කම්කරු පන්තිය මත දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීම මගින් දැවැන්ත යුද පිරිවැය බලෙන් පටවනු ඇත. ඒ සමඟම, රජයට බලය යොදා විරුද්ධත්වය මර්දනය කිරීමට සිදුවනු ඇත. මිලියන 93 ක ජනගහනයක් සිටින රටකට එරෙහිව දීර්ඝ යුද්ධයක් සඳහා විදේශයන්හි බෝම්බ සහ හමුදා පමණක් නොව, රට තුළ රුදුරු පොලිස් රාජ්‍යයක් අවශ්‍ය වේ.

ට්‍රම්ප් පරිපාලනයේ විදේශ ප්‍රතිපත්තියේ අතිශය සාපරාධීභාවය, එක්සත් ජනපදය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වලට එරෙහිව කරන යුද්ධයෙන් වෙන් කළ නොහැකිය. "නීති විරෝධී සංක්‍රමණිකයන්" විසින් සමූහ ඡන්දය ප්‍රකාශ කරන බවට වූ ව්‍යාජ ප්‍රකාශ හරහා, 2026 මැතිවරණ වංචා කිරීමට හෝ ඒවා සම්පූර්ණයෙන්ම අත්හිටුවීමට පවා පාලන තන්ත්‍රය විවෘතව පියවර ගනිමින් සිටී. ඒ සමගම එහි යුද්ධ, කප්පාදු සහ මර්දන ප්‍රතිපත්තිවලට විරුද්ධ වන අය සමූහ වශයෙන් වටලනු ලබන බවට තර්ජන නිකුත් කරයි.

ට්‍රම්ප් තන්ත්‍රය ආරම්භ කර ඇත්තේ ඔවුන් පුරෝකථනය නොකළ ප්‍රතිවිපාක සහිත හෝ පාලනය නොකරන යුද්ධයකි. එහි ක්‍රියාවන්හි උමතුවක අංගයක් ඇත, නමුත් එය පන්ති අවශ්‍යතා තුළ මුල් බැසගත් උමතුවකි. ඉරානයට එරෙහි යුද්ධය පැන නගින්නේ, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ මිලිටරි ප්‍රචණ්ඩත්වය හරහා එහි ආර්ථික පරිහානියට එරෙහිව සටන් කිරීමේ අත්‍යවශ්‍යතාවයෙන් මෙහෙයවනු ලබන, දශක ගණනාවක් තිස්සේ වර්ධනය වන එක්සත් ජනපද ආක්‍රමණකාරිත්වයෙන් ය.

අපරාධකාරී කතිපයාධිකාරයේ මෙහෙයුම් වසා තැබිමෙන් ඉතිරිව තිබූ කිසියම්ම හෝ වැස්මක් ඉරා දමා ඇති, එප්ස්ටීන් හෙළිදරව් කිරීම් මගින් තීව්‍ර වී ඇති රට තුළ උත්සන්න වන දේශපාලන අර්බුදයකට ට්‍රම්ප් පරිපාලනය මුහුණ දී සිටී. මෙය අපරාධවල ගිලී සිටින සහ වැඩෙන මහජන කෝපයෙන් තර්ජනයට ලක්ව ඇති රජයක්, එවැනි ආණ්ඩු සැමවිටම කරන ආකාරයටම ප්‍රතිචාර දක්වයි: එනම්, එය යුද්ධය මගින් ගැලවීම සොයයි.

ඉරාන ජනතාවට, ගිනිගැනීමේ තර්ජනයට ලක්ව ඇති කලාපයට සහ සමස්ත ලෝකයටම, මෙම යුද්ධයේ මූලාරම්භය සහ ප්‍රතිවිපාක පිළිබඳව චෝදනා පත්‍ර තබා, ආයතනික මාධ්‍ය සහ දේශපාලන සංස්ථාපිතය පුරා කිසිදු බැරෑරුම් පැහැදිලි කිරීමක්වත් නොමැත.

ට්‍රම්ප් බිය වන්නේ ඩිමොක්‍රටික් පක්ෂයට නොවේ. ඩිමොක්‍රටික් නායකත්වය දණ ගසා සිටින බවත්, යුද මේසයේ ආසනයක් සදහා පමණක් යදිමින් සිටින බවත් ඔහු හොඳින් දනී. මේ සතියේ, සෙනෙට් සභා සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩල ඩිමොක්‍රටිකයන් යුද්ධයට විරුද්ධ බව මවාපාමින්, නමුත් ඇත්ත වශයෙන්ම කිසිවක් නොකරමින්, වෙනම දේශපාලන රංගන දෙකක් ඉදිරියට ගෙනෙමින් සිටිති.

ඉරානයේ ට්‍රම්ප්ගේ ක්‍රියාමාර්ග සීමා කරන නීති, යුද බලතල පනත යටතේ සම්පාදනය කිරීම සඳහා සෙනෙට් සභාව ඡන්දය ප්‍රකාශ කරනු ඇත. එය සම්මත වුවද,—එය බොහෝ විට විය නොහැක්කකි—නොවැළැක්විය හැකි ට්‍රම්ප්ගේ නිෂේධ බලය ජය ගැනීමට අවශ්‍ය සීමාවෙන් එය සිදු නොවනු ඇත. නීතියක බලය නොමැති සහ ට්‍රම්ප්ගේ සාපරාධී යුද්ධයට සුළුම හෝ බාධාවක්වත් නියෝජනය නොකරන ඔවුන්ගේ "යුද විරෝධී" පනත් කෙටුම්පත, හුදු යෝජනාවක් ලෙස ඉදිරිපත් කිරීමෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඩිමොක්‍රටිකයන් මෙම ගැටලුව මඟ හැරියහ.

මෙය යුද්ධයට විරුද්ධත්වයක් නොව සහයෝගීතාවයකි. ඩිමොක්‍රටික් පක්ෂය වෝල් වීදියේ සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පක්ෂයකි. එය රිපබ්ලිකන් පක්ෂය සේම එකම පන්ති අවශ්‍යතා ආරක්ෂා කරන අතර එක්සත් ජනපද මිලිටරිවාදයේ ගෝලීය මෙහෙයුම් සඳහා කැපවී සිටී. එහි ප්‍රධාන බිය වන්නේ ට්‍රම්ප්ගේ යුද්ධය සහ ආඥාදායකත්වය නොව, පහළින් ව්‍යාපාරයක් මතුවීමයි.

තීව්‍ර වන යුද අර්බුදය, සමාජවාදී සමානතා පක්ෂයේ (එ.ජ) ජාතික කමිටුව විසින් ඊයේ නිකුත් කරන ලද "ඉරානයට එරෙහි සාපරාධී එක්සත් ජනපද-ඊශ්‍රායල යුද්ධය නවත්වනු!" යන <u>ප්‍රකාශයේ</u>හදිසිභාවය අවධාරනය කරයි. යුද්ධයට එරෙහි සටන දියත් කළ යුතු පදනම එම ප්‍රකාශයෙන් ගෙනහැර දැක්වීය: **පළමුව**, යුද්ධයට එරෙහි අරගලය, ජනගහනයේ සියලු ප්‍රගතිශීලී කොටස් එය පිටුපස එක්සත් කරමින් සමාජයේ මහා විප්ලවවාදී බලවේගය වන කම්කරු පන්තිය මත පදනම් කළ යුතුය.

**දෙවනුව, නව යුද විරෝධී ව්‍යාපාරය ධනවාදී විරෝධී සහ සමාජවාදී විය යුතුය; මන්ද, මූල්‍ය ප්‍රාග්ධනයේ ආඥාදායකත්වය සහ මිලිටරිවාදයේ සහ යුද්ධයේ මූලික හේතුව වන ආර්ථික ක්‍රමය අවසන් කිරීමේ සටනකින් තොරව යුද්ධයට එරෙහි බරපතල අරගලයක් තිබිය නොහැකි බැවිනි.**

**තෙවනුව, නව යුද විරෝධී ව්‍යාපාරය ධනේශ්වර පන්තියේ සියලුම දේශපාලන පක්ෂ සහ සංවිධානවලට සතුරු වන අතර, ඒවායින් සම්පූර්ණයෙන්ම සහ නිසැකවම ස්වාධීන විය යුතුය.**

**හතරවනුව, නව යුද විරෝධී ව්‍යාපාරය, සියල්ලටත් වඩා, ජාත්‍යන්තර විය යුතු අතර, අධිරාජ්‍යවාදයට එරෙහි ඒකාබද්ධ ගෝලීය අරගලයක් තුළ කම්කරු පන්තියේ දැවැන්ත බලය බලමුලු ගැන්විය යුතුය.**

මෙම සාපරාධී යුද්ධයට සහ මැදපෙරදිගට එල්ල කරන සමස්ත ඇමරිකානු-ඊශ්‍රායල ප්‍රහාරයට එරෙහිව බලමුලු ගැන්වෙන ලෙස අපි කම්කරුවන්ගෙන් සහ තරුණයින්ගෙන් ඉල්ලා සිටිමු. කර්මාන්තශාලා, වරායන්, සැපයුම් මධ්‍යස්ථාන, පාසල් සහ රෝහල්, සාකච්ඡා සහ සංවිධානාත්මක ප්‍රතිරෝධයේ මධ්‍යස්ථාන බවට පත්විය යුතුය. මෙම යුද්ධය වහාම අවසන් කරන ලෙස ඉල්ලා රැස්වීම් කැඳවිය යුතුය. මෙම ආක්‍රමණය යුක්ති සහගත කරන බොරු හෙළිදරව් කළ යුතුය. විරුද්ධත්වය නිහඬ කිරීමට ගන්නා සෑම උත්සාහයක්ම ප්‍රතික්ෂේප කළ යුතුය. යුද්ධයට සහ ආඥාදායකත්වයට එරෙහිව ජාත්‍යන්තර සමාජවාදී වැඩපිළිවෙලක් සඳහා සටනට උර දිය යුතුය.

මුල් පිටුවේ ඡායාරූපය: 2026 මාර්තු 2 වන සඳුදා වොෂින්ටනයේ පෙන්ටගන්හි පැවති මාධ්‍ය හමුවකදී ආරක්ෂක ලේකම් පීට් හෙග්සෙත් කතා කරයි. [AP ඡායාරූපය]

# ඇමරිකානු අධිරාජ්‍යවාදයේ සමූලඝාතක යුද්ධය මැද ඉරානය සිදු කරන ආත්මාරක්ෂක ප්‍රහාර එක්සත් ජාතීන්ගේ සංවිධානය හෙළා දකී



ඉරානයේ ISNA ප්‍රවෘත්ති ඒජන්සියෙන් ලබාගත් මෙම පින්තූරයේ දැක්වෙන්නේ 2026 පෙබරවාරි 28 වන දින ඉරානයේ දකුණු හෝමොස්ගන් පළාතේ මිනාබ් හි බාලිකා පාසලකට ප්‍රහාරයක් එල්ල වූ ස්ථානයයි. (ඡායාරූපය අලි නජාෆි / ISNA / AFP විසින් ගෙට් ඉමේජස්)

**ජෝර්දාන් ෂිල්ටන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *12* වන දින ‘***United Nations condemns Iran’s self-defence strikes amid American imperialism’s war of extermination***’ යන හිසින් පළවූ ජෝර්දාන් ෂිල්ටන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පසුගිය බදාදා දින, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලය (UNSC) විසින් 2817 (2026) යෝජනාව සම්මත කිරීමත් සමඟ ඉරානයට එරෙහි එක්සත් ජනපද-ඊශ්‍රායල යුද්ධය ස්ඵල ලෙස අනුමත කරන ලදී. මෙහිදී, මෙම යෝජනාව ගල්ෆ් රාජ්‍යයන්ට එරෙහිව ඉරානය එල්ල කළ පළිගැනීමේ ප්‍රහාර “දැඩි ලෙස හෙළා දකින” අතර, ඇමරිකානු අධිරාජ්‍යවාදය සහ එහි ඊශ්‍රායල සහචරයා විසින් මිලියන 90 ක ජනතාවක් වෙසෙන රටට (ඉරානයට) සති දෙකකට ආසන්න කාලයක් බෝම්බ හෙලීම ගැන කිසිවක් නොකියයි.

යෝජනාවේ කඩතුරාව නම්, බහරේනය, කුවේට්, ඕමානය, කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ජෝර්දානය යන රටවල් හතට එරෙහිව පළිගැනීමේ ප්‍රහාර දියත් කළ බවයි. නමුත් මෙම රටවල් හතම– බහරේනයේ පස්වන බලඇණියේ මූලස්ථානයේ සිට කටාර්හි අල් උඩෙයිඩ් ගුවන් කඳවුර සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අල් ධෆ්රා දක්වා–එක්සත් ජනපද හමුදා ඉරානයට එරෙහිව යුද්ධය දියත් කිරීම සඳහා ක්‍රියාකාරීව භාවිතා කරනු ලබන සත්කාරක හමුදා කඳවුරු සඳහා පහසුකම් සපයයි. මෙම රාජ්‍යයන් මධ්‍යස්ථ නරඹන්නන් නොවේ. ඔවුන් ඇත්ත වශයෙන්ම සටන් වැදි රාජ්‍යයන්ය. ඔවුන්ගේ භූමි ප්‍රදේශවලට ඉරාන ප්‍රහාර එල්ල කර ඇත්තේ ආත්මාරක්ෂාව සඳහා වන අතර සිවිල් වැසියන් 11 ක් පමණ මරණයට පත්ව ඇත. එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය විසින් ඉරානයේ පමණක් පුද්ගලයින් 1,300 කට වැඩි පිරිසක් මරා දමා ඇත.

ෆැසිස්ට්වාදී ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ නායකත්වයෙන් යුත් එක්සත් ජනපදය පෙබරවාරි 28 වන දින ඓතිහාසිකව පීඩිත රටක් වන ඉරානයට එරෙහිව ප්‍රකෝප නොකෙරුණු ආක්‍රමණශීලී යුද්ධයක් දියත් කළ බව යෝජනාවේ සඳහන් නොවීය. තම සියොන්වාදී සගයාගේ බලගතු සහාය ඇතිව, වොෂින්ටනය පැය කිහිපයක් ඇතුළත උත්තරීතර නායක අයතුල්ලා කමේනි සහ පැහැදිලිවම ස්වෛරී රාජ්‍යයක ප්‍රමුඛ දේශපාලන හා හමුදා නිලධාරීන් දුසිම් ගනනක් ඉලක්ක කර ගනිමින් ඝාතන සිදු කළේය.

කාපට් බෝම්බ ප්‍රහාරවල සති දෙකකටත් අඩු කාලයක් තුළ, ඇමරිකානු සහ ඊශ්‍රායල මිසයිල මගින් ඉරාන සිවිල් වැසියන් දහස් ගණනක් ඝාතනය කරනු ලැබ ඇත. ඉන් එක් ප්‍රහාරයකින් ගැහැණු ළමයින් 160 කට

වැඩි පිරිසක් ඝාතනය විය. මෙම යුද අපරාධකරුවන් විසින් රෝහල් සහ පාසල් දුසිම් ගණනකට පහර දී, බලශක්ති සැපයුම් කඩාකප්පල් කිරීමට සහ තෙල් පිරිපහදු විනාශ කිරීමෙන් පරිසරය විෂ කිරීමට උත්සාහ කර ඇත. මින් ඉරානයේ සහ ලෙබනනයේ මිලියන සංඛ්‍යාත ජනතාවට තම නිවෙස්වලින් පලා යාමට බල කර ඇත. එහිදී සියොන්වාදී තන්ත්‍රය ගුවන් හා භූමි මෙහෙයුම් ද සිදු කරනු ලැබ ඇත. මේ කිසිවක් එතරම් දුරට සඳහනක් කළ යුතු එවා ලෙස ගණන් ගෙන නැත.

යෝජනාව එයට විපක්ෂව ඡන්ද 0ක් ද, පක්ෂව ඡන්ද 13ක් ද ලැබීමෙන් සම්මත විය. එක්සත් ජාතීන්ගේ නියෝජිතයෝ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ යුද අරමුණු සරලව පිටපත් කර ඇති ආකාරයක් දක්වන යෝජනාව සම්මත කිරීම නිවේදනය කරන මාධ්‍ය නිවේදනයේ මෙසේ සඳහන් විය: “එය නේවාසික ප්‍රදේශ සහ සිවිල් වස්තූන්ට එරෙහිව ඉරානයේ ප්‍රහාර විශේෂයෙන් හෙළා දකින අතර ඒවා වහාම නතර කරන ලෙස ඉල්ලා සිටී—එසේම ටෙහෙරානය සමුද්‍ර වෙළඳාමට ඇඟිලි ගැසීම අරමුණු කරගත් එහි තර්ජන, ප්‍රකෝප කිරීම් සහ කලාපය පුරා ප්‍රොක්සි කණ්ඩායම්වලට දෙන සහාය ද  නතර කරන ලෙස ඉල්ලා සිටී.”

මෙම  සාහසික ලේඛනයට පක්ෂව ඡන්දය දුන් රටවල් අතරට ස්ථිර සාමාජිකයන් වන බ්‍රිතාන්‍යය, ප්‍රංශය සහ එක්සත් ජනපදය මෙන්ම ස්ථිර නොවන සාමාජිකයන් වන බහරේන්, කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, ඩෙන්මාර්කය, ග්‍රීසිය, ලැට්වියාව, ලයිබීරියාව, පකිස්ථානය, පැනමාව සහ සෝමාලියාව ඇතුළත් විය.

විශේෂයෙන් වැදගත් වන්නේ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයන් වන සහ එම නිසා යෝජනාවට නිෂේධ බලය යෙදිය හැකි ස්ථානයක සිටින රුසියාව සහ චීනය, ඡන්දය දීමෙන් වැළකී සිටීමින්, එය සම්මත කිරීමට ඉඩ දීමයි. එසේ කිරීමෙන්, ඔවුහු ඉරානයට එරෙහි සමූලඝාතන යුද්ධය සඳහා ඇමරිකානු අධිරාජ්‍යවාදයට දේශපාලනික සහාය ලබා දුන්හ. කාලකණ්නි ලෙස මුහුණ බේරා ගැනීමේ කටයුත්තක් ලෙස, රුසියාව දෙවන යෝජනාවක් ඉදිරිපත් කළ අතර එය කිසි විටෙකත් සම්මත නොවන බව ඔවුන් දැන සිටියේය. එම යෝජනාව යුද්ධය අවසන් කර රාජ්‍ය තාන්ත්‍රික විසඳුමක් ඉල්ලා සිටියේය. ස්ථිර සාමාජිකයින් 15 දෙනාගෙන් හතර දෙනෙකු පමණක් එයට සහාය දැක්වීය.

මෙම ශෝචනීය ක්‍රියාකාරිත්වය ගලා එන්නේ මෙම ධනේශ්වර පාලන තන්ත්‍ර දෙකෙහි සමාජ ස්වභාවය සහ අවශ්‍යතා මගිනි. නේටෝව ක්‍රමානුකූලව රට වටලෑම සහ යුක්රේනයේ රුසියාවට එරෙහිව එක්සත් ජනපද-නේටෝ යුධ ප්‍රකෝප කිරීම නොතකා, රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් තවමත් විශ්වාස කරන්නේ, රුසියානු කතිපයාධිකාරයට තමන්ගේම කම්කරු පන්තිය සූරාකෑමට සහ බලපෑම් ක්ෂේත්‍රයක් පාලනය කිරීමට ඇති “අයිතිය” පිළිගන්නා වොෂින්ටනය සමඟ සම්මුතියක් ඇති කර ගත හැකි බවයි.

ඉරානය විනාශ කිරීමට සහ එහි සම්පත් කොල්ලකෑමට වොෂින්ටනයට සහාය දීමෙන්, අධිරාජ්‍යවාදය සමඟ “සාමකාමී සහජීවනය” යන පැරණි ස්ටැලින්වාදී මන්ත්‍රය මත ක්‍රියාත්මක වන ක්‍රෙම්ලිනය, යුක්රේනය සහ එක්සත් ජනපද ආයෝජන පිළිබඳව ට්‍රම්ප් සමඟ සම්මුතියකට එළැඹීමට හැකි වේ යැයි බලාපොරොත්තු වේ.

ෂී ජින්පින්ගේ නායකත්වයෙන් යුත් චීන රජය සම්බන්ධයෙන් ගත් කල, ආසන්නතම කාලය තුළ ප්‍රධාන සලකා බැලීමක් වන්නේ මෙම මස අවසානයේ ට්‍රම්ප් බීජිං වෙත පැමිණීමට නියමිත සංචාරයයි. චීන ධනවාදය ඇමරිකා එක්සත් ජනපදය සමඟ ආර්ථික පිළිවෙළකට එළඹීමේ අපේක්ෂාව පවත්වා ගැනීම සඳහා, මෙම ස්ටැලින්වාදී තන්ත්‍රය විසින් එහි ප්‍රකට සගයා වන ඉරානයේ වියදමින් යුද අපරාධකරු ට්‍රම්ප්ට රාජ්‍ය තාන්ත්‍රික ජයග්‍රහණයක් ලබා දීමට බොහෝ සෙයින් කැමැත්තෙන් සිටී.

නමුත් බීජිං සහ මොස්කව්හි පාලක කල්ලි විසින් බෙදා ගන්නා මෙම මනඃකල්පිතයන් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අත්‍යවශ්‍යතාවයන් සමඟ නොගැලපේ. ප්‍රධාන බලවතුන් අතර ලෝකය සහ එහි සම්පත් වල නව බෙදීමක් හොඳින් සිදුවෙමින් පවතී. එහෙයින්, එක්සත් ජනපදය එහි ආධිපත්‍යවාදී තත්වයට කිසිදු අභියෝගයක් සාමකාමීව පිළිගැනීමට සූදානම් නැත. ඊට පටහැනිව, වොෂින්ටනය බීජිං සහ මොස්කව් වෙත පණිවිඩයක් යවමින් සැලකර සිටින්නේ ඔවුන් ඊළඟට පහර කෑමේ ලැයිස්තුවේ සිටින බවයි.

දශක තුනකට වැඩි කාලයක් තිස්සේ, ලේ වැකි ආක්‍රමණශීලී යුද්ධ මාලාවක් තුළ එහි තවමත් අතිමහත් මිලිටරි ආධිපත්‍යය යෙදවීමෙන් එහි වේගවත් වන ආර්ථික පරිහානියට වන්දි ගැනීමට වොෂින්ටනය උත්සාහ කර ඇත. මෙම වැඩ පිළිවෙළ දිගටම කරගෙන යමින්, ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඉරාන යුද්ධය ප්‍රථමයෙන්ම අරමුණු කරන්නේ ආසියාව සහ යුරෝපය අතර වෙළඳ මාර්ග සඳහා උපායමාර්ගිකව පිහිටා ඇති ප්‍රධාන බලශක්ති අපනයන කලාපයක් වන මැද පෙරදිග පුරා එක්සත් ජනපද ආධිපත්‍යයට ඇති ප්‍රධාන කලාපීය බාධකය ඉවත් කිරීමයි.

කෙසේ වෙතත්, යුද්ධයේ වඩාත් මූලික ඉලක්කය වන්නේ රුසියාව සහ චීනය තවදුරටත් උපායමාර්ගිකව සහ ආර්ථික වශයෙන් හුදකලා කිරීමයි. විශේෂයෙන් චීනය ලාභ ඉරාන තෙල් ආනයන මත සැලකිය යුතු ප්‍රමාණයකට රඳා පවතී. වොෂින්ටනය වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝ පැහැරගෙන ගොස් කැරකස්හි කීකරු රූකඩ ආණ්ඩුවක් ස්ථාපිත කිරීමෙන් මාස දෙකකටත් අඩු කාලයකට පසුව යුද්ධය ආරම්භ විය. එය ( වෙනිසියුලාව) 2026 ජනවාරි දක්වා චීනයට තවත් ප්‍රධාන තෙල් අපනයනකරුවෙකු වූ අතර දැන් ඇමරිකානු බලශක්ති සමාගම්වල බලකොටුවක් බවට පත්වෙමින් තිබේ.

දෙවන ලෝක යුද්ධයේ භීෂණයෙන් පසු ජාත්‍යන්තර නීතිය සහ රාජ්‍ය තාන්ත්‍රිකභාවය මගින් පනවා ඇති ඉතිරි

සීමා කිරීම් අද සියලුම අධිරාජ්‍යවාදී බලවතුන් පසෙකට දමා ඇත. ලෝක සමාජවාදී වෙබ් අඩවිය වසර දෙකකට පෙර පැහැදිලි කළ පරිදි, “ශිෂ්ටාචාරය ම්ලේච්ඡත්වයෙන් වෙන් කරන සියලුම ‘රතු රේඛා’ මකා දමමින් සිටී”. බදාදා ඡන්දයෙන් දැන් 2817 යෝජනාවට සම අනුග්‍රහය දැක්වීම හරහා ආණ්ඩු 140 කට අධික සංඛ්‍යාවක අනුමැතිය මෙම ඉරානයට එරෙහි සමූලඝාතන යුද්ධයට ලැබී ඇත. එයට පෙරාතුව, ගාසා තීරයේ පලස්තීනුවන්ට එරෙහි අධිරාජ්‍යවාදීන්ගේ සහාය ඇතිව සිදු කරන ලද ජන සංහාරය සිදු විය. මෙම සංහාරයට උතුරු ඇමරිකාවේ සහ යුරෝපයේ අධිරාජ්‍යවාදී බලවතුන්ගේ සහාය ලැබුණු අතර, ඔවුහු සියොන්වාදී ඝාතකයන්ට ආයුධ සැපයුවා පමණක් නොව, රට තුළ ජන සංහාරයට එරෙහි සියලු ආකාරයේ විරුද්ධත්වයන් ක්‍රමානුකූලව මර්දනය කළහ.

ලෝකයේ බලවත්ම අධිරාජ්‍යවාදී රාජ්‍යයේ ප්‍රධානියා වන ට්‍රම්ප්, අධිරාජ්‍යවාදී ම්ලේච්ඡත්වයට වඩාත්ම විකාර සහගත සහ පිළිකුල් සහගත ප්‍රකාශනයක් ලබා දෙයි. විදේශයන්හි ඔහුගේ ආක්‍රමණශීලී යුද්ධ රට තුළ ෆැසිස්ට් ආඥාදායකත්වයක් ස්ථාපිත කිරීමේ ඔහුගේ මෙහෙයුම සමඟ අත්වැල් බැඳගනී.

නමුත් පාලක පන්තියේ ගමන් දිශාව සෑම තැනකම එක හා සමානයි. මේ සතියේ යුරෝපීය කොමිසමේ සභාපති උර්සුලා වොන් ඩර් ලේන් සිය කතාවකදී ප්‍රකාශ කළේ, “යුරෝපයට තවදුරටත් පැරණි ලෝක පිළිවෙළට, ගෙවී ගිය සහ යළි නොඑන ලෝකයකට භාරකරුවෙකු විය නොහැක”. ප්‍රංශ ජනාධිපති එමානුවෙල් මැක්‍රොන් තම රටේ න්‍යෂ්ටික අවි ගබඩාව පුළුල් කරමින් මහාද්වීපය පුරා අවි ස්ථානගත කිරීමට පොරොන්දු වෙමින් සිටී. ජර්මනියේ පාලක ප්‍රභූව එහි මිලිටරිය සඳහා යුරෝ ට්‍රිලියන 1 ක් වියදම් කරමින් ලෝක බලය සඳහා තවත් අල්ලා ගැනීමක් සූදානම් කරමින් සිටී. මෙම යුද අයවැයවල සම්පූර්ණ බර කම්කරු පන්තිය මත පැටවීම සඳහා, මහාද්වීපය පුරා පාලක ප්‍රභූන් අන්ත දක්ෂිණාංශික පක්ෂවලට බලය ලබා ගැනීමට මග පාදමින් සිටී.

තරඟකාරී ජාතික රාජ්‍යයන් අතර සබඳතා නැවත සමතුලිත කිරීමෙන් දක්ෂ රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ “බහුධ්‍රැව” ධනේශ්වර සංවර්ධනයක් මගින් අධිරාජ්‍යවාදී ලෝක යුද්ධය වළක්වා ගත හැකි බවට වන මොස්කව් සහ බීජිංහි රජයේ නිලධාරීන්ගේ විශ්වාසය මායාවකි.

වසර 30 කට පෙර, ප්‍රමුඛ ස්ටැලින්වාදී නිලධරයෝ, සෝවියට් සංගමය විසුරුවා හැර ධනවාදය නැවත ස්ථාපිත කළහොත්, අධිරාජ්‍යවාදීන් තමන්ව මහා බලවතුන්ගේ කවයට සහ ලෝක ධනවාදී වෙළඳපොළට සාදරයෙන් පිළිගනු ලබන බවට තමන්ටම ඒත්තු ගන්වා ගත්හ. එදා මෙන්ම අදත්, ධනේශ්වර සංවර්ධනය සඳහා වූ ඔවුන්ගේ ජාතික යෝජනා ක්‍රම, ගෝලීයකරණය වූ ආර්ථිකය සහ ලෝකය ජාතික රාජ්‍යයන් ලෙස බෙදී තිබීමේ ලෝක ධනවාදයේ වෛෂයික ප්‍රතිවිරෝධතාව සමඟ ගැටේ. මහා බලවතුන් තුන්වන ලෝක යුද්ධයකට තල්ලු කරන ප්‍රතිවිරෝධතාවය මෙයයි.

ලියොන් ට්‍රොට්ස්කි 1930 ගණන්වල ධනේශ්වර බිඳවැටීමේ පෙර කාල පරිච්ඡේදයකදී මෙම ආස්ථානයන් පිළිබඳව ආමන්ත්‍රණය කළේය. අධිරාජ්‍යවාදී බලවතුන් දෙවන ලෝක යුද්ධය කරා වේගයෙන් දිව යත්ම, සෝවියට් සංගමයේ ස්ටැලින්වාදී නිලධරය ලෝක සමාජවාදී විප්ලවයේ වැඩසටහනේ ඉතිරිව තිබූ සියලු ආකාරයේ අවශේෂයන් බිඳ දමා, කොමින්ටර්න්ය ( 3න් වන ජාත්‍යන්තරය) ජාත්‍යන්තර කම්කරු පන්තියේ ප්‍රධාන කඩාකප්පල් කරන්නා සහ පාවා දෙන්නා බවට පත් කළේය. නිලධරයේ වරප්‍රසාදිත ස්ථානය ආරක්ෂා කර ගැනීම සඳහා ජාතීන්ගේ සංගමය හරහා අධිරාජ්‍යවාදීන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ගොඩනගා ගැනීම කෙරෙහි සෝවියට් සංගමයේ විදේශ ප්‍රතිපත්තිය යොමු කළේය.

ට්‍රොට්ස්කි 1936 දී අධිරාජ්‍යවාදී රාජ්‍ය තාන්ත්‍රිකභාවය පිළිබඳ ප්‍රබන්ධය කටුක විවේචනයට ලක් කරමින් මෙසේ ලිවීය: “පවතින තත්ත්වය ආරක්ෂා කිරීමේදී ලීගය ‘සාමයේ’ සංවිධානයක් නොව, මානව වර්ගයාගේ අතිමහත් බහුතරය කෙරෙහි අධිරාජ්‍යවාදී සුළුතරයේ ප්‍රචණ්ඩත්වයේ සංවිධානයකි. මෙම ‘පිළිවෙළ’, පවත්වා ගත හැක්කේ, අද යටත් විජිතවල සහ හෙට මහා බලවතුන් අතර, අඛණ්ඩ කුඩා හා විශාල යුද්ධවල ආධාරයෙන් පමණි .”

අධිරාජ්‍යවාදී යුද්ධය නැවැත්වීමට ඇති එකම පදනම ජාත්‍යන්තර කම්කරු පන්තිය විප්ලවවාදී සමාජවාදී වැඩපිළිවෙලක් මත බලමුලු ගැන්වීමයි. ඉරානයට එරෙහි යුද්ධය නැවැත්වීම පිළිබඳ ඉරිදා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර ඔන්ලයින් රැස්වීමේදී (webinar) ඩේවිඩ් නෝර්ත් අවධාරණය කළ පරිදි, සමාජවාදීන් “යුද සිතියම අනුගමනය නොකළ යුතුය, නමුත් පන්ති අරගලයේ සිතියම අනුගමනය කළ යුතුය.”

මෙම දිශානතියේ හදිසිභාවය UNSC ඡන්දයෙන් පැහැදිලි වේ. ඉරාන ජනතාව ඝාතනය කිරීම සහ කලාපය පුරා තවත් මිලියන ගණනකගේ ජීවිත අවදානමට ලක් කිරීම සම්බන්ධයෙන් ලෝකයේ කිසිදු රජයක් අතර ප්‍රතිපත්තිමය වශයෙන් විරෝධයක් නොමැත. නමුත්, ලොව පුරා කම්කරුවන් අතර මෙම යුද්ධයට වන විරෝධය දැනටමත් ශක්තිමත් වන අතර යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාක ඉදිරියේ දී ක්‍රියාත්මක වන විට එය තවත් උත්සන්න වනු ඇත. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සහ එහි සමාජවාදී සමානතා පක්ෂ ඉදිරියේ ඇති කර්තව්‍යය වන්නේ අධිරාජ්‍යවාදී යුද්ධයේ මූල හේතුව වන ධනවාදය පෙරලා දැමීම සඳහා මෙම වර්ධනය වන ව්‍යාපාරය සමාජවාදී වැඩපිළිවෙලකින් සන්නද්ධ කිරීමයි.

මුල් පිටුවේ ඡායාරූපය: එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස්, 2025 සැප්තැම්බර් 22 වන සඳුදා ඉහළ මට්ටමේ සතිය ආරම්භයේදී එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේදී UNGA හි 80 වන සැසිවාරය අමතයි [AP ඡායාරූපය/ ඇන්ජලිනා කට්සානිස්]

# “මහා ඊශ්‍රායලය” න්‍යාය පත්‍රය හඹා යාම සඳහා නෙතන්යාහු ඉරාන යුද්ධය භාවිතා කරයි

**ජීන් ෂෝල්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *18* වන දින ***‘Netanyahu uses Iran war to pursue “Greater Israel” agenda’*** යන හිසින් පළවූ ජීන් ෂෝල් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

අගමැති බෙන්ජමින් නෙතන්යාහුගේ අන්ත දක්ෂිණාංශික රජය, ලෙබනන්, පලස්තීන සහ ඉරාන යන සියලු ප්‍රතිරෝධයන් තලා දමමින්, මහා ඊශ්‍රායලයක් ස්ථාපිත කිරීම සඳහා ඉරානයට එරෙහි එක්සත් ජනපද-ඊශ්‍රායල යුද්ධය භාවිතා කරමින් සිටී.

ඉරානයට පහර දී දින කිහිපයක් ඇතුළත, ඊශ්‍රායල ආරක්ෂක හමුදා (IDF) හිස්බුල්ලා සංවිධානයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළේය. මෙය, ඉරානයේ උත්තරීතර නායක අයතුල්ලා අලි කමේනි ඊශ්‍රායලය විසින් ඝාතනය කිරීමට ප්‍රතිචාර වශයෙන් එම කණ්ඩායම (හිස්බුල්ලා) සංකේතාත්මක රොකට් ප්‍රහාර මාලාවක් එල්ල කිරීමට කළකට පෙර (IDF) කෙටුම්පත් කරන ලද සැලැස්මක් සක්‍රීය කිරීමකි.

ඊශ්‍රායලය හිස්බුල්ලා සංවිධානය සමඟ 2024 දී අති කළ සටන් විරාම ගිවිසුම 10,000 වතාවකට වඩා බිඳ දමා ඇති අතර, එමඟින් එය කිසිදු සාකච්ඡා විසඳුමක් ප්‍රතික්ෂේප කරන බව පෙන්නුම් කරයි. එහි අරමුණ හිස්බුල්ලා විනාශ කිරීම, ඉරානයේ බලපෑම ඉවත් කිරීම සහ ලෙබනනය යටත් කර ගැනීමයි.

1980 ගණන්වල ෂියා දුප්පතුන්ගේ මහජන ව්‍යාපාරයක් ලෙස හිස්බුල්ලා සංවිධානය මතු වූ අතර, එය ලෙබනනයේ සිවිල් යුද්ධයේ–එක්සත් ජනපද මැදිහත්වීම මගින් අවුලුවන ලද යුද්ධයේ–කෝව සහ 1982 සිට 2000 දක්වා ඊශ්‍රායලය දකුණේ කුරිරු අත්පත් කර ගැනීම හේතුවෙන් මතු විය. ඊශ්‍රායලයේ ලෙබනනයේ ආධිපත්‍යයට ඇති ප්‍රධාන බාධකය එයයි.



2026 මාර්තු 16 වන සඳුදා, ලෙබනනයේ බේරූට් හි දකුණු තදාසන්න ප්‍රදේශයක් වන ඩහියේ හි ඊශ්‍රායල ගුවන් ප්‍රහාරයකින් හානි වූ ගොඩනැගිලිවල සුන්බුන් වීදියක විසිරී ඇති ආකාරය . [AP ඡායාරූපය/බිලාල් හුසේන්]

ඊශ්‍රායලයේ මහජන විකාශන ආයතනයක් වන KAN වාර්තා කරන්නේ, පූර්ණ පරිමාණයේ ගොඩබිම් ආක්‍රමණයක් අපේක්ෂාවෙන්, සංචිත හමුදා (reservists) බලමුලු ගැන්වීමේ සීමාව සංචිත භටයින් 450,000 දක්වා ඉහළ නැංවීමට රජය සලකා බලමින් සිටින බවයි. එය වත්මන් අවසර ලත් සීමාව මෙන් දෙගුණයකට ආසන්නය. ලෙබනනයට ගොඩබිම් හමුදා යවන අතරතුර, ලිටානි ගඟට දකුණින් ජීවත් වන සහ බේරූට්හි දකුණු තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන් සමූහ වශයෙන් ඉවත් කිරීමට IDF නියෝග කර ඇත.

මෙය 1996 වසරේ ක්‍රියාත්මක කරන ලද පරිමාණයෙන් අතිශයින් විනාශකාරී වූ ඔපරේෂන් ග්‍රේප්ස් රැත් (Operation Grapes of Wrath) මෙහෙයුමේ නැවත නිරූපණයකි. එම මෙහෙයුමෙන් සිවිල් වැසියන් මිලියන භාගයක් පමණ අවතැන් වූ අතර, කානාහි එක්සත් ජාතීන්ගේ ගොඩනැගිලි සංකීර්ණයකට එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරයක් හේතුවෙන් 106 දෙනෙකු මිය ගියේය.

දකුණු ලෙබනනය, බේරූට් හි දකුණු සහ මධ්‍යම දිස්ත්‍රික්ක සහ බෙකා නිම්නය වෙත ඊශ්‍රායලය විසින් එල්ල කරන ලද වත්මන් බෝම්බ හෙලීම් හේතුවෙන් අසල්වැසි ප්‍රදේශ සහ යටිතල පහසුකම් සමතලා වී ඇත. අවම වශයෙන් ළමුන් 111 දෙනෙකු ඇතුළුව 912 කට වැඩි පිරිසක් මිය ගොස් ඇත; තුවාල ලබා ඇති පිරිස 2,200 ක් වන අතර ලෙබනනයේ ජනගහනයෙන් සියයට 17 ක්, එනම් මිලියනයකට ආසන්න සංඛ්‍යාවක් ඔවුන්ගේ නිවාසවලින් පලවා හැර ඇත.

සිවිල් වැසියන් සහ සිවිල් යටිතල පහසුකම් හිතාමතා ඉලක්ක කිරීම යුද අපරාධයක් බවත්, ඊශ්‍රායලයේ පුළුල් අවතැන්වීමේ නියෝග ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කළ හැකි බවත් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය අනතුරු අඟවා තිබේ.

පාසල්, නාගරික ගොඩනැගිලි සහ පොදු ශාලා තාවකාලික නවාතැන් බවට පත්

කර ඇතත්, දහස් ගණනක් මෝටර් රථවල හෝ වීදිවල නිදා සිටිති. ලෙබනන් සමාජයේ වඩාත්ම සූරාකෑමට ලක් වූ ස්ථර වන්නේ සංක්‍රමණික ගෘහ සේවිකාවන්, ලේඛනගත නොකළ සරණාගතයින් සහ අප්‍රිකාවෙන් සහ ආසියාවෙන් පැමිණි කම්කරුවන් වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු නවාතැන් වලින් ඉවතට හරවා යවා ඇති අතර, ඔවුන්ට ආධාර ලැබීම අහිමි කරනු ලැබ තිබේ. ලෝකයේ ඉහළම ඒක පුද්ගල සරණාගත ජනගහනයක් ඇති රට ලෙස දැනටමත් සත්කාරකත්වය දරන ලෙබනනය එහි අද්දරට තල්ලු වෙමින් පවතී: දළ වශයෙන් සිරියානුවන් මිලියන 1.3 ක් (නිල වශයෙන් ලියාපදිංචි කර ඇත්තේ 716,000 ක් පමණි), පලස්තීන සරණාගතයින් 200,000 කට වැඩි පිරිසක් සහ ඉතියෝපියාව, බංග්ලාදේශය, පිලිපීනය, කෙන්යාව සහ වෙනත් තැන්වල සිට සංක්‍රමණික සේවකයින් 160,000 ක් පමණ ඊට ඇතුළත්ය.

ලෙබනනයේ ජනාධිපති ජෝසප් අවුන් පවසා ඇත්තේ බේරූට් ඊශ්‍රායලය සමඟ සෘජු සාකච්ඡා සඳහා සූදානම් බවත් සාකච්ඡා සඳහා සටන් විරාමයක් ඉල්ලා සිටින බවත්ය. නමුත් ලෙබනන් රජය හිස්බුල්ලා සංවිධානයට නැවත සන්නද්ධ වීමට සහ නැවත ගොඩනැගීමට ඉඩ දී ඇති බව පවසමින් ඊශ්‍රායලය මෙය ප්‍රතික්ෂේප කළේය. හිස්බුල්ලා සංවිධානය නිරායුධ කරන තුරු අමතර ලෙබනන් භූමි ප්‍රදේශ අත්පත් කර ගන්නා බවත් ජාතික යටිතල පහසුකම් විනාශ කිරීම දිගටම කරගෙන යන බවත් ආරක්ෂක අමාත්‍ය ඊශ්‍රායල් කැට්ස් තර්ජනය කළේය. ජනතාව භීතියට පත් කිරීමෙන් ඔවුන් හිස්බුල්ලා සංවිධානයට එරෙහිව හැරෙනු ඇති බවත්, ලෙබනන් හමුදාවට ඊශ්‍රායලයේ නියෝජිතයා (proxy) ලෙස ක්‍රියා කිරීමට බල කෙරෙනු ඇති බවත් ගණනය කරමින් ලෙබනනයට “මිල ගෙවීමට” සිදුවන බව ඔහු ප්‍රකාශ කළේය.

එක්සත් ජනපදයේ සහාය ලබන අන්තර්කාලීන සිරියානු ජනාධිපති අහමඩ් අල්-ෂාරාගේ සැබෑ සහයෝගය මගින් ඊශ්‍රායලය ගෙනියන මෙම ව්‍යාපාරය තවදුරටත් ශක්තිමත් වේ. සටන්කරුවන් සහ ආයුධ සංචලනය සීමා කිරීම සඳහා ඔහුගේ හමුදා ලෙබනන් සහ ඉරාක දේශසීමා මත පාලනය දැඩි කර ඇති අතර, ලෙබනනය එහි නැගෙනහිර අභ්‍යන්තරයට සම්බන්ධ කළ කොරිඩෝව වසා දමා සිරියාවේ ආරක්ෂක උපකරණ ඊශ්‍රායලයේ යුද අරමුණු සමඟ පෙළගස්වා ඇත. හිස්බුල්ලා නිරායුධ කිරීමට සහාය වීම සඳහා නැගෙනහිර ලෙබනනයට හමුදා යෙදවීම සලකා බලන ලෙස එක්සත් ජනපදය සිරියාවෙන් ඉල්ලා තිබේ.

**ඊශ්‍රායලය ගාසා තීරයේ සාගත ප්‍රතිපත්තිය නැවත ආරම්භ කරයි**

ඉරානයට එරෙහි එක්සත් ජනපද-ඊශ්‍රායල ප්‍රහාරය ආරම්භ වූ විගසම ඊශ්‍රායලය විසින් ගාසා තීරය කුසගින්නෙන් පුරවා ලීම නැවත ආරම්භ කළ අතර එය සාගතය පිළිබඳ බිය නැවත ඇති කළේය. එය (ඊශ්‍රායලය) “ආරක්ෂක හේතූන් මත” සෑම හරස් මාර්ගයක්ම වසා දමා ආහාර, අත්‍යවශ්‍ය සැපයුම් සහ මානුෂීය සේවකයින්ගේ සේවය කපා දැමීය. මෙමගින්, ඔක්තෝබර් 10 වන දින එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ වංචනික ෂර්ම් එල්-ෂෙයික් ගිවිසුම විධිමත් ලෙස වළලා දැමීය.

හරස් මාර්ග නැවත විවෘත කරන ලෙස එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් ඊශ්‍රායලයෙන් ඉල්ලා සිටීමෙන් පසුව, ඊශ්‍රායල බලධාරීහු අකමැත්තෙන් කෙරෙම් ෂාලෝම් හි තනි ගේට්ටුවක් විවෘත කර සංකේතාත්මක ආධාර බිඳුවක් ගලා ඒමට ඉඩ සැලසීය. මාර්තු 8 වන දින වන විට ගාසා තීරයට ඇතුළු වූයේ ට්‍රක් රථ 83 ක් පමණි: ඉන් 50 ක් මානුෂීය සැපයුම් රැගත් අතර වාණිජ භාණ්ඩ රැගෙන ලොරි 33ක් පැමිණියේය. මාර්තු 10 වන දින, ට්‍රක් රථ 200ක්, එනම් ආධාර සහිත ට්‍රක් රථ 200 ක් සහ වෙළඳපොළ සඳහා ආහාර සහිත ට්‍රක් රථ 30 ක් පමණක් ඇතුළුවීමට අවසර දෙන ලදී. මෙම සොච්චම් ප්‍රමාණයන් පවා සිරකර දැමීමත් සමඟ ආහාර මිල ගණන් අහස උසට ඉහළ නැග ඇත. වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා ඊජිප්තුවට යැවීම සම්පූර්ණයෙන්ම නතර වී ඇති අතර, එමගින් ළමුන් 4,000 ක් ඇතුළුව 18,000 ක ජනතාවක් සෞඛ්‍ය පිරිහීමට හෝ මරණයට පත් වීම සඳහා අතහැර දමා තිබේ.

ගාසා තීරයට එරෙහි ඊශ්‍රායල ගුවන් ප්‍රහාර අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර, ඉරානයට එරෙහි යුද්ධය මගින් නව මහා පරිමාණ ප්‍රහාරයක් යට ගහනු ඇතැයි යන බිය මතු කරයි. ගාසා නගරයේ අවතැන් වීමට බල කෙරුණු පවුල් සඳහා වූ කඳවුරුවලට යුද ගුවන් යානා බෝම්බ හෙලා තිබේ. ෂර්ම් එල්-ෂෙයික් ගිවිසුමෙන් පසු, ඊශ්‍රායලය ගාසා තීරයේ පලස්තීනුවන් 648 දෙනෙකු ඝාතනය කර ඇති අතර තවත් 1,728 දෙනෙකුට තුවාල සිදු කර තිබේ.

පසුගිය සතියේ යුරෝ-මෙඩ් මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය විසින් ඊශ්‍රායලය ගාසා තීරයේ අධ්‍යාපන පද්ධතිය ක්‍රමානුකූලව විනාශ කිරීම විස්තර කළේ “ජනගහනයේ අධ්‍යාපනය යථා තත්වයට පත් කිරීම වැළැක්වීම අරමුණු කරගත් හිතාමතාම සිදු කරන ප්‍රතිපත්ති” ලෙසයි. IDF විසින් පාසල් ගොඩනැගිලි 668 කට බෝම්බ හෙලා, රජයේ පාසල් 179 ක් විනාශ කර, තවත් 118 කට දැඩි ලෙස හානි සිදු කර ඇත. එය UNRWA (මැදපෙරදිග පලස්තීන සරණාගතයින් සඳහා එක්සත් ජාතීන්ගේ සහන සහ වැඩ ඒජන්සිය)පාසල් 100 කට පහර දී, විශ්ව විද්‍යාල ගොඩනැගිලි 63 ක් විනාශ කර, ඉතිරි උසස් අධ්‍යාපන ආයතන නටබුන් බවට පත් කර ඇත.

මාතෘ හා නවජ සෞඛ්‍ය සේවා බිඳ වැටී ඇති බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් වාර්තා කරයි. සියලුම සෞඛ්‍ය පහසුකම්වලින් සියයට හැටක් අක්‍රීය පවතී. දරු ප්‍රසූතියට අත්‍යවශ්‍ය ඖෂධ ඇතුළුව සියලුම ඖෂධ තොග වලින් අඩක් පමණ කිසිවක් ඇත්තේ නැත.

ඊශ්‍රායල් වටලෑම යුද්ධයේ අවියකි: එය, සාගින්න, රෝග සහ ජීවිතය පවත්වා ගැනීමට හැකියාව ඇති සෑම සමාජ

ආයතනයක්ම විනාශ කිරීම මගින් ගාසා තීරයේ ජනගහනය බිඳ දැමීමට සැලසුම් කර ඇති ගණන් බලා කරන ලද මහා පරිමාණ අහිමි කිරීමේ ප්‍රතිපත්තියකි.

### ඊශ්‍රායලය බටහිර ඉවුර සහ ගාසා තීරය වාර්ගිකව සුද්ධ කිරීමට සූදානම් වේ

පසුගිය මාසයේ දී, බටහිර ඉවුරේ සිවිල් පරිපාලනය සඳහා වගකීම දරන ෆැසිස්ට් මුදල් අමාත්‍ය බෙසලෙල් ස්මොට්‍රිච් ප්‍රකාශ කළේ, පලස්තීන ප්‍රශ්නයට ඔහුගේ “දිගුකාලීන විසඳුම” ජනවාර්ගික සුද්ධ කිරීම බවයි. ඊළඟ ඊශ්‍රායල රජය “ඔස්ලෝ ගිවිසුම් අවලංගු කර ඊශ්‍රායල ස්වෛරීභාවය බටහිර ඉවුරට ව්‍යාප්ත කළ යුතු” බවත්, බටහිර ඉවුරෙන් සහ ගාසා තීරයෙන් පලස්තීනුවන් “සංක්‍රමණය කිරීම දිරිමත් කිරීම සඳහා ප්‍රායෝගික පියවර” ගත යුතු බවත් ඔහු පැවසීය.

(IDF) “පූර්වභංග ආරක්ෂක වළල්ලක් පැනවීය.” පලස්තීන භූමිය පුරා ඇති සියලුම මුරපොලවල් වසා දමන ලදී. නගර සහ ගම් අතර මාර්ග යකඩ ගේට්ටු සහ පස් ගොඩැලි වලින් අවහිර කරන ලද අතර, කලින් කිසිවක් නොතිබූ ස්ථානවල යකඩ ගේට්ටු සවි කරන ලදී. ගාසා යුද්ධයෙන් පසු හමුදාව වසා දැමූ ප්‍රදේශවල පලස්තීනුවන්ගේ තාවකාලික මාර්ග ඊශ්‍රයෙල් ආක්‍රමණික පදිංචිකරුවන් විසින් මුද්‍රා තබන ලදී. මෙය බටහිර ඉවුරේ විවිධ ප්‍රදේශ අතර සියලු සංචලනය වළක්වන අතර, මිනිසුන්ට රැකියාවට යාමට, වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සහ සමහර අවස්ථාවල සාප්පුවකට යාමට අවකාශය අසුරයි.

2024 නොවැම්බර් මාසයේ සිට මාස 12ක් තුළ, වාඩිලාගෙන ඇති බටහිර ඉවුර පුරා පලස්තීනුවන් 36,000කට වැඩි පිරිසක් බලහත්කාරයෙන් අවතැන් කර ඇති බව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයා වාර්තා කර ඇත. නීති විරෝධී ඊශ්‍රායල ජනාවාස ව්‍යාප්තිය සහ භූමිය ඈඳා ගැනීමේ තල්ලුව වේගවත් වෙමින් පවතින බවට කාර්යාලය අනතුරු ඇඟවීය. එම කාලය තුළම ජීවිත හානි හෝ දේපළ හානි සිදු කරමින් ඊශ්‍රායල ආක්‍රමණික පදිංචිකරුවන්ගේ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් 1,732ක් වාර්තා කර ඇත. මාර්තු මස ආරම්භයේ සිට අවම වශයෙන් පලස්තීන ජාතිකයින් පස් දෙනෙකු ඝාතනය කරමින් ආක්‍රමණික පදිංචිකරුවන් ග්‍රාමීය ප්‍රජාවන්ට එල්ල කරන ප්‍රහාර උත්සන්න කර ඇත. ඉරාන යුද්ධයේ පළමු දින හතර තුළ පමණක් විවිධ පලස්තීන ප්‍රජාවන් 37කට, ඊශ්‍රායල් ආක්‍රමණික පදිංචිකරුවන් විසින් සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් 50ක් පිළිබඳව රාජ්‍ය නොවන ඊශ්‍රායල මානව හිමිකම් සංවිධානයක් වන යෙෂ් ඩින් විසින් වාර්තා කර ඇත. මෙම ආක්‍රමණික පදිංචිකරුවන් සම්පූර්ණයෙන්ම පාහේ හමුදාවේ සහාය සහිතව ක්‍රියාත්මක වේ. දිවි ගලවා ගැනීම සඳහා සමහර පලස්තීනුවන්ට තම ඉඩම් සොච්චම් මුදලකට ආක්‍රමණික පදිංචිකරුවන්ට විකිණීමට බල කෙරෙමින් පවතී.



2024 ජනවාරි 7 වන දින ඊශ්‍රායලයේ ටෙල් අවිව් හි ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති සතිපතා කැබිනට් රැස්වීමේදී ඊශ්‍රායල අගමැති බෙන්ජමින් නෙතන්යාහු, මුදල් අමාත්‍ය බෙසලෙල් ස්මොට්‍රිච් සමඟ කතා කරයි. [AP ඡායාරූපය/රොනන් ස්වුලුන්]

ගාසා යුද්ධය ආරම්භ වත්ම, ආණ්ඩුව පලස්තීනුවන් ඊශ්‍රායලයට ඇතුලු වීම තහනම් කළේය. 140,000 කට අධික පිරිසක් එහි ඉදිකිරීම් හා කෘෂිකර්මාන්තයේ සේවය කරමින් සිටි අතර, එමගින් ඔව්හු, බටහිර ඉවුරේ සාමාන්‍ය දෛනික වැටුප මෙන් දෙගුණයකටත් වඩා උපයා ගත්හ. මෙය 2025 අවසානය වන විට විරැකියා අනුපාතය සියයට 40 දක්වා ඉහළ නැංවීය. මෙම භයානක තත්වය තවත් උග්‍ර කරන්නේ පලස්තීන අධිකාරිය වෙනුවෙන් එකතු කරන ලද බදු ආදායම ඊශ්‍රායලය විසින් රඳවා තබා ගැනීමයි. එහි කාර්ය මණ්ඩලය කෙටි පැය ගණනකට යෙදවීමෙන් සහ වැටුප් ගෙවීම් ප්‍රමාද කිරීමෙන් පසු, එය දැන් බිඳවැටීමට මුහුණ දී සිටී.

ඉරානයට එරෙහි යුද්ධය ආරම්භ වූ විගසම IDF විසින් අල්ලාගෙන සිටි බටහිර ඉවුර සම්පූර්ණයෙන්ම මිලිටරිමය වශයෙන් වසා දැමීය. එමගින්, ග්‍රාමීය පලස්තීන ප්‍රජාවන් ඔවුන්ගේ භූමියෙන් නෙරපා හැරීමට ඊශ්‍රායල ආක්‍රමණික පදිංචිකරුවන්ට (settlers) නිදහස ලබා දුන්නේය. එය

# ඉරානයට එරෙහි යුද්ධය පන්ති අරගලය තීව්‍ර කරනු ඇත

**ජෝෂෆ් කිශෝර්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* මාර්තු *15* වන දින ***'The war against Iran will intensify the class struggle'*** යන හිසින් පළවූ ජෝෂෆ් කිශෝර් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

එක්සත් ජනපදයේ විශාලතම හරක් මස් සැකසුම් මධ්‍යස්ථානයන්ගෙන් එකක් වන කොලරාඩෝ හි ග්‍රීලි හි ජේබීඑස් කම්හලේ මස් ඇසුරුම් කම්කරුවන් *3,800* කට ආසන්න සංඛ්‍යාවක් අද වැඩ වැරීමකට නියමිතව ඇත. දරිද්‍රතා වැටුප් සහ අනාරක්ෂිත තත්වයන්ට විරෝධය පළ කරමින් කම්කරුවන් පසුගිය මාසයේ වැඩවර්ජන ක්‍රියාමාර්ගයට පක්ෂව සියයට *99* ක් ඡන්දය දුන්හ. මිනසෝටා හි ඔස්ටින්හි *1985-86* හෝමෙල් *(Hormel)* වැඩ වර්ජනයෙන් පසු එක්සත් ජනපදයේ මස් ඇසුරුම් කම්කරුවන්ගේ විශාලතම වැඩ වර්ජනය මෙය වේ.

ග්‍රීලි කම්කරුවන්ගෙන් බොහෝ දෙනෙක් හයිටි සහ සෝමාලියාවෙන් මෑතකදී පැමිණි සංක්‍රමණිකයන් වන අතර, ඔවුන් ට්‍රම්ප් පරිපාලනය යටතේ පිටුවහල් කිරීමේ යාන්ත්‍රයෙන් ඍජු තර්ජනයට ලක්ව සිටී. කෙසේ හෝ, ඔවුහු වැඩ වර්ජනය කිරීමට ඡන්දය ලබා දුන්හ. ග්‍රීලි කම්කරුවන්ගේ ධෛර්යය සහ අධිෂ්ඨානය ඇමරිකාවේ පන්ති සබඳතාවල පුපුරන සුලු තත්ත්වය පිළිබිඹු කරයි.

මස් ඇසුරුම් කම්කරුවන්ගේ වැඩ වර්ජනය ආරම්භ වන්නේ යුද්ධයේ පසුබිම තුළය. සති දෙකකට පෙර, එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය ඉරානයට එරෙහිව සිය සාපරාධී ආක්‍රමණික යුද්ධය දියත් කළ අතර එය කලාපීය හා ගෝලීය ගැටුමක් දක්වා වේගයෙන් සර්පිලාකාර වෙමි පවතී.

මෙම යුද්ධයේ හේතු බහුවිධ හා සංකීර්ණ වේ. ඉරානය දිගු කලක් තිස්සේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඉලක්කයක් වී ඇති අතර, එය මැද පෙරදිග තෙල් සම්පත්වල ආධිපත්‍යය දැරීමට දශක ගණනාවක් තිස්සේ ව්‍යාපාරයක් දියත් කර ඇත. ඝාතනය සහ සමූහ සංහාරය හරහා ඉරාන රජය පෙරලා දැමීමේ උත්සාහය, චීනයට එරෙහි ඇමරිකානු පාලක පන්තියේ ප්‍රහාරය සහ ගෝලීය ආධිපත්‍යය සඳහා වන ධාවනය සමඟ බැඳී ඇත.



2026 මාර්තු 4 වන දින ඉරානයේ ටෙහෙරානයට එක්සත් ජනපද-ඊශ්‍රායල හමුදා කාපට් බෝම්බ ප්‍රහාරයක් එල්ල කරයි

කෙසේ වෙතත්, ප්‍රධාන සාධකයක් වන්නේ එක්සත් ජනපදය තුළ පවතින සමාජ අර්බුදයයි. ඉතිහාසය පුරාම, ගැඹුරු අභ්‍යන්තර අර්බුදවලට මුහුණ දෙන පාලන තන්ත්‍රයන් යුද්ධය හරහා ඒවා විසඳීමට උත්සාහ කර ඇත. මැකින්ලි පරිපාලනය 1898 ස්පාඤ්ඤ-ඇමරිකානු යුද්ධය දියත් කළේ උත්සන්න වූ පන්ති ගැටුමක් සහ ආර්ථික අවපාතයේ ප්‍රතිවිපාක මධ්‍යයේ ය; සාර්වාදී රුසියාවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍ය වියචෙස්ලාව් ප්ලෙහ්ව් 1904 දී ජපානය සමඟ යුද්ධයට පක්ෂව කතා කළේ, "විප්ලවයේ රැල්ල මැඩපැවැත්වීම සඳහා කෙටි, ජයග්‍රාහී යුද්ධයක් මේ රටට අවශ්‍ය වන්නේය" යන පදනම මත ය. 1905 විප්ලවයේදී එම ගණනය කිරීමට සුදුසු ප්‍රතිචාරය ලැබුණි.

කෙසේ වෙතත්, මෙම ප්‍රවණතාවයේ වඩාත්ම විනාශකාරී ප්‍රකාශනයන් වන්නේ විසිවන සියවසේ ලෝක යුද්ධ දෙක වේ. 1914 දී යුරෝපයේ පාලක පන්තීන් යුද්ධය සැලකුවේ, නැගී එන කම්කරු පන්ති අරගලයේ රැල්ල ජාතිකවාදී දේශප්‍රේමයේ (nationalist patriotism) ගිල්වීමේ මාධ්‍යයක් ලෙස ය. යුද්ධයම 1917 රුසියානු විප්ලවයට සහ යුරෝපය පුරා විප්ලවවාදී නැගිටීම්වලට හේතු විය. දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන්, හිට්ලර්ගේ නොනවතින මිලිටරිකරණය සහ ආක්‍රමණශීලී ව්‍යාපාරය ජර්මානු අධිරාජ්‍යවාදයේ අත්‍යවශ්‍යතාවයන් සහ, ඉතිහාසඥ ටිම් මේසන් සඳහන් කර ඇති පරිදි, රට තුළ "බිඳවැටීම සහ අවුල් සහගත තත්ත්වය" වළක්වා ගැනීමේ උත්සාහය යන දෙකම විසින් මෙහෙයවනු ලැබීය.

ට්‍රම්ප් පරිපාලනයේ ක්‍රියාමාර්ග මගින් ඊට සමාන පීඩන පිළිබිඹු වේ. 2026 මුල් මාස දෙක තුළ ආධිපත්‍යය දැරූ ගැටළු සලකා බලන්න. ජනවාරි සහ පෙබරවාරි මාසවලදී, පසුගිය වසරේ දැවැන්ත "නෝ කිංග්ස්" (රජුන් එපා!)

පෙළපාලිවලින් පසුව ඇති වූ සමාජ විරෝධතා රැල්ලකින් එක්සත් ජනපදය සෙලවී ගියේය. ප්‍රේරකය වූයේ මිනියාපොලිස්-ශාන්ත පෝල් වෙත ෆෙඩරල් ආගමන (ICE) නියෝජිතයන් 3,000 ක් පමණ යෙදවීම සහ ජනවාරි 7 වන දින ICE නියෝජිතයෙකු විසින් රෙනී නිකොල් ගුඩ්ව වෙඩි තබා ඝාතනය කිරීමයි. ජනවාරි 23 වන දින, මිනියාපොලිස් හි දස දහස් ගණනක් ජනයා, -30°F ක සීතලට මුහුණ දෙමින් විරෝධතා පෙළපාළි ගියහ. එහිදී, වෘත්තීය සමිති යාන්ත්‍රණයෙන් හෝ ඩිමොක්‍රටික් පක්ෂයෙන් නොව, පහළින් [සාමාන්‍ය කම්කරුවන්ගෙන්] මහා වැඩ වර්ජනයක් සඳහා වැඩෙන ඉල්ලීම් මත විය.

ඊට, ට්‍රම්ප් පරිපාලනයේ සහ එහි ICE සහ රේගු සහ දේශසීමා ආරක්ෂණ (CBP) හි ගෙස්ටාපෝ නියෝජිතයින්ගේ ප්‍රතිචාරය වූයේ ඇලෙක්ස් ප්‍රෙට්ටි ඝාතනය කිරීමයි. රට පුරා විරෝධතා පැතිර ගිය අතර, උසස් පාසල් සිසුන්ගේ රට පුරා විරෝධතා රැල්ලක් ඇති විය. එක් ගණන් ගැනීමකට අනුව, 2026 දී පමණක්, ප්‍රාන්ත 48 ක් සහ කොලොම්බියා දිස්ත්‍රික්කයේ පාසල් දිස්ත්‍රික්ක 236 ක විරෝධතා 334 ක් පැවැත්විණි.

ඒ සමඟම, කම්කරු පන්තිය තුළ සැලකිය යුතු වැඩ වර්ජන ව්‍යාපාරයක් වර්ධනය වෙමින් පැවති අතර, එය පාලනය කිරීමට වෘත්තීය සමිති යාන්ත්‍රණය උමතු ලෙස කටයුතු කළේය. නිව් යෝර්ක් නගරයේ, හෙදියන් 15,000 ක් මාසයකට වැඩි කාලයක් වැඩ වර්ජනයක නිරත විය. 2026 ජනවාරි මස 26 වන දින, කයිසර් පර්මෙන්ටේ හි හෙදියන් සහ සෞඛ්‍ය සේවකයින් 31,000 ක් ඇමරිකානු ඉතිහාසයේ විශාලතම සෞඛ්‍ය සේවා වැඩ වර්ජනවලින් එකක් වන කැලිෆෝනියාවේ සහ හවායි හි විවෘත වැඩ වර්ජනයකට සහභාගි විය. පෙබරවාරි 9 වන දින, සැන් ෆ්‍රැන්සිස්කෝ ගුරුවරුන් 6,400 ක් වැඩි වැටුප් සහ ප්‍රමාණවත් පාසල් අරමුදල් ඉල්ලා වැඩ වර්ජනය කළහ.

සමාජ විරෝධතා සහ වැඩ වර්ජන ආදී ක්‍රියාමාර්ග පුපුරා යාම, දශක ගණනාවක් තිස්සේ දැවැන්ත සමාජ අසමානතාවයේ සහ කතිපයාධිකාරයක් අත පෙර නොවූ විරූ ධන සංකේන්ද්‍රණයක ප්‍රතිවිපාක ප්‍රකාශ කරයි. පාලක පන්තිය ලේ වැකි රැකියා කප්පාදුවක් සිදු කරමින් සිටින අතර, පහත වැටෙන ජීවන තත්වයන් සහ ගැඹුරු වන අනාරක්ෂිත භාවය කම්කරුවන් විසින් පිළිගත යුතු යැයි ඉල්ලා සිටී. එක්සත් ජනපදය රාජ්‍ය හා පෞද්ගලික ණය දැවැන්ත හා තිරසාර නොවන ලෙස ප්‍රසාරණය වීමකට සහ ඩොලරයේ ගෝලීය සංචිත තත්වයට එල්ල වන තර්ජනවලට සහ වැටුප් ගිල දමමින් පවතින උද්ධමනකාරී පීඩනයන්ට මුහුණ දී සිටී.

වරදකරු කරනු ලැබූ අපරාධකරුවෙකු විසින් මෙහෙයවන ලද ට්‍රම්ප් පරිපාලනය, ජනගහනයේ වර්ධනය වන කොටස් විසින් වෛර කරනු ලැබේ. ජනවාරි අග දී සිදු කරන ලද පිව් පර්යේෂණ මධ්‍යස්ථානයේ (Pew Research Cente) සමීක්ෂණයකින් ට්‍රම්ප්ගේ මහජන ප්‍රසාදයේ ශ්‍රේණිගත කිරීම සියයට 37 ක් පමණක් වූ අතර ඇමරිකානුවන්ගෙන් සියයට 50 ක් කියා සිටියේ ඔහුගේ පරිපාලනයේ ක්‍රියාමාර්ග ඔවුන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා නරක බවයි. ට්‍රම්ප් දැන් මුළු වසරක්ම මහජන ප්‍රසාදයේ ශුද්ධ ඍණ ශ්‍රේණිගත කිරීමක් සමඟ ගත කර ඇත.

ජෙෆ්රි එප්ස්ටයින් ලිපිගොනු වලින් මිලියන ගණනක් ලේඛන නිකුත් කිරීම ට්‍රම්ප්ගේ දූෂිතභාවය පිළිබඳ තවත් සාක්ෂි සපයා ඇතිවා පමණක් නොව, ඇමරිකානු පාලක පන්තියේ සහ පක්ෂ දෙකෙහිම එහි දේශපාලන නියෝජිතයින්ගේ සදාචාරාත්මක කුණුවීම ද හෙළිදරව් කර තිබේ. යුද්ධය හරහා "මාතෘකාව වෙනස් කිරීමට" උත්සාහ කිරීමේදී, ට්‍රම්ප් ක්‍රියා කරන්නේ ධනේශ්වර කතිපයාධිකාරයේ නියෝජිතයා ලෙස ය.

ඩිමොක්‍රටික් පක්ෂය ට්‍රම්ප් පරිපාලනයේ ප්‍රතිපත්ති සහ අපරාධවලට ගැඹුරින් සම්බන්ධ වී සිටී. ඔවුන් ව්‍යාජ විපක්ෂයකි. ඔවුන් ඉරානයට එරෙහි යුද්ධයට සහ එහි රජය පෙරලා දැමීමට සහාය දක්වයි. යුද ධාවනය වේගවත් වන විට, දැවැන්ත මිලිටරි වියදම් පියවරයන් සම්මත කර ගැනීම සහතික කිරීමට ඩිමොක්‍රටික් නායකයෝ කටයුතු කළහ. ICE මර්දනය සහ දේශපාලන ප්‍රචණ්ඩත්වයට එරෙහිව විරෝධතා පැනනැඟුණු විට, ඩිමොක්‍රටික් නිලධාරීහු ට්‍රම්ප් සමඟ එකඟතාවයකට පැමිණියහ.

ඩිමොක්‍රටික් පක්ෂයේ සහයෝගීතා උන්මාදයට නිව්යෝර්ක් නගරාධිපති සහ ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදීන්ගේ සාමාජික සොහ්රාන් මම්දානි ද ඇතුළත් වේ. යුද්ධයට පෙර මාස කිහිපය තුළ ට්‍රම්ප් හමුවූ ඔහු , බෝම්බ ප්‍රහාරය ආරම්භ වීමට දින දෙකකට පෙර එක් වරක් ඇතුළුව දෙවරක් හමුවිය.

ට්‍රම්ප්ට මාතෘකාව වෙනස් කිරීමට අවශ්‍යව ඇත. මාධ්‍යයට මාතෘකාව වෙනස් කිරීමට අවශ්‍යව ඇත. ඩිමොක්‍රටික් පක්ෂයට ද මාතෘකාව වෙනස් කිරීමට අවශ්‍යව ඇත. නමුත් යුද්ධය අභ්‍යන්තර අර්බුද අඩු කිරීමට වඩා ඒවා තීව්‍ර කරමින් පවතී. ඉරානයට එරෙහි යුද්ධය ආරම්භයේ සිටම විශාල ලෙස ජනප්‍රියත්වයෙන් තොරය. යුද්ධයේ ආර්ථික ප්‍රතිවිපාක ක්ෂණික හා දරුණු වී ඇති අතර, ඉහළ යන තෙල් මිල ද ඊට ඇතුළත් ය. ගැටුමේ මුල් දින හය තුළ පමණක් වැය කරන ලද ඩොලර් බිලියන 11.3, සමාජ වැඩසටහන් වලට ගෙවනු ලබන සමාජ සම්පත් දැවැන්ත ලෙස යුද්ධයට හරවා යැවීමක් නියෝජනය කරයි. යුද්ධය පුළුල් වන විට සහ මරණ සංඛ්‍යාව වැඩි වන විට විරුද්ධත්වය වර්ධනය වනු ඇත.

2003 දී ඉරාක යුද්ධය ආරම්භයේදී ලෝක සමාජවාදී වෙබ් අඩවිය මෙසේ ලිවීය:

"ආරම්භ වී ඇති ගැටුමේ ආරම්භක අවධීන්හි ප්‍රතිඵලය කුමක් වුවත්, ඇමරිකානු අධිරාජ්‍යවාදයට ව්‍යසනය මුනගැසෙනු ඇත. එයට ලෝකය ජය ගත නොහැක. එයට මැද පෙරදිග ජනතාව මත යටත් විජිත විලංගු නැවත පැටවිය නොහැක. යුද්ධයේ මාධ්‍යය

හරහා එහි අභ්‍යන්තර රෝග සඳහා ශක්‍ය විසඳුමක් සොයා ගැනීමට එයට නොහැකි වනු ඇත. ඒ වෙනුවට, යුද්ධයෙන් ජනනය වන අනපේක්ෂිත දුෂ්කරතා සහ නැගී එන ප්‍රතිරෝධය ඇමරිකානු සමාජයේ සියලු අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා තීව්‍ර කරනු ඇත."

එම සටහන ලියා දශක දෙකකට වැඩි කාලයක් තුළ, ඇමරිකානු සමාජයේ "අභ්‍යන්තර රෝග" ඉස්මත්තට පැමිණ ඇත. ධවල මන්දිරයේ මැර කල්ලි නායකයා වන ට්‍රම්ප්ම මෙම යථාර්ථයේ නිෂ්පාදනයක් සහ පුද්ගලාරෝපණයකි. ඉරානයට එරෙහි යුද්ධය, එහි සියලු කුරිරු අපරාධකාරීත්වය මෙන්ම එය ක්‍රියාත්මක කරන ආණ්ඩුවද හරහා, විනාශය කරා වේගයෙන් ගමන් කරන ධනේශ්වර කතිපයාධිකාරීත්වයක් සහ සියලු දේශපාලන සුජාතභාවය අවසන් කරන සමාජ පිළිවෙලක් හෙළිදරව් කරයි.

අර්බුදයේ පරිමාණය රජයේ වඩ වඩාත් නොසැලකිලිමත් ක්‍රියාමාර්ගවලට හේතු වේ. මිනියාපොලිස් හි ඇමරිකානු පුරවැසියන් ඝාතනය කිරීමේදී ප්‍රකාශ වූ ඒකාධිපතිත්වය සඳහා වූ කුමන්ත්‍රණය දිගටම පවතී. ඉරානය සම්බන්ධයෙන් පරිපාලනය ප්‍රකාශ කර ඇත්තේ "කිසිවක් මේසයෙන් පිටත නැත" යනුවෙනි—ලෝකයේ විශාලතම න්‍යෂ්ටික අවි ගබඩාවක් ඇති රජයකින් පිටවන වාක්‍ය ඛණ්ඩයක් එහි වචනාර්ථයෙන්ම ගත යුතුය.

නමුත් යුද්ධය සහ ඒකාධිපතිත්වය විසින් ඇති කරන එම ප්‍රතිවිරෝධතාම පන්ති ගැටුම් ද තීව්‍ර කරයි. යුද්ධය 2026 මුල් මාසවල පුපුරා ගිය අරගලවල අන්තර්ගතය වෙනස් නොකරයි. එය ඒවාට වැඩි හදිසි බවක් ලබා දෙයි. කොලරාඩෝ හි ග්‍රීලි හි JBS කම්හලෙන් දැන් ආරම්භ වන වැඩ වර්ජනය කම්කරු පන්තිය තුළ විරුද්ධත්වය ගැඹුරු වෙමින් හා පුළුල් වෙමින් පවතින බවට බලගතු ඇඟවීමකි.

අවශ්‍ය වන්නේ වැටුප්, සූරාකෑම, අසමානතාවය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ මෙම අරගල, ඒකාධිපතිත්වයට එරෙහි සටන සහ උත්සන්න වන හා විනාශකාරී යුද්ධයට එරෙහි විරෝධය සමඟ ඒකාබද්ධ කිරීමයි.

මෙය, ක්‍රමානුකූලව වැඩ වර්ජන හුදකලා කිරීමට, විරුද්ධත්වය මර්දනය කිරීමට සහ රාජ්‍යයේ සහ සංගතවල අවශ්‍යතාවලට කම්කරුවන් යටත් කිරීමට කටයුතු කරන ඩිමොක්‍රටික් පක්ෂය, ආයතනික මාධ්‍ය හෝ වෘත්තීය සමිති යාන්ත්‍රණය හරහා කළ නොහැකිය. ඒ සඳහා නිලධාරිවාදයේ ග්‍රහණයෙන් මිදීම සහ කලාප සහ දේශසීමා හරහා සම්බන්ධ වී ඇති සෑම වැඩබිමකම සහ කර්මාන්තයකම ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම අවශ්‍ය වේ.

කම්කරු පන්තියේ මෙම ස්වාධීන බලය සංවිධානය කිරීමේ මාධ්‍යයක් ලෙස, කම්කරු ක්‍රියාකාරී කමිටු වළ ජාත්‍යන්තර කම්කරු සන්ධානය (IWA-RFC) පුළුල් කිරීම සඳහා සමාජවාදී සමානතා පක්ෂය කැඳවුම් කර සිටී. **යුද්ධයට එරෙහි සටන එය නිපදවන ධනේශ්වර ක්‍රමයට එරෙහි සටනෙන් වෙන් කළ නොහැකිය. විකල්පය වන්නේ ම්ලේච්ඡත්වය ( යුද්ධය, මර්දනය සහ සමාජ විනාශය) හෝ සමාජවාදයයි: එනම්, බලය ලබා ගැනීමට, යුද යන්ත්‍රය විසුරුවා හැරීමට, කතිපයාධිකාරී පාලනය අවසන් කිරීමට සහ පුද්ගලික ලාභය නොව මානව අවශ්‍යතාවයේ පදනම මත ආර්ථික ජීවිතය ප්‍රතිසංවිධානය කිරීමට කම්කරු පන්තියේ දේශපාලන බලමුලු ගැන්වීම සිදු කළ යුතුව පවතී.**

---

**ගාසා ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදය බිංග කරනු! සයොන්වාදය පරාජය කරනු!**

**යුද අපරාධකරුවන් වගවීමට ලක් කරනු!**

**ඉරානයට අත නොතබනු - ඇමරිකානු-ඊශ්‍රායල යුද්ධය වහා නවතනු!**

**සියලුම ඇමරිකානු හමුදා නැවත කැඳවනු! කඳවුරු වසා දමනු!**

**තෙල් සඳහා තවත් ලේ නැත — සම්පත් අත්පත් කර ගැනීම අවසන් කරනු!**

**මිලිටරිය සඳහා අරමුදල් නවතනු! පාසල්, රෝහල්, නිවාස සඳහා අරමුදල් සපයනු!**

**ඉරාන කම්කරුවන් සමඟ සහයෝගිතාවය ගොඩ නගනු! අධිරාජ්‍යවාදී ආක්‍රමණයට හා පාලක රෙජිමයට එරෙහිව ඉරාන ජනතාව ආරක්ෂා කරනු!**

**කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනගනු! ජාත්‍යන්තරව සෑම සේවා ස්ථානයකම කාර්මික ශක්තිය එක්සත් කරනු!**

**වැඩ අඩාල කිරීමේ සිට මහා වැඩ වර්ජනය දක්වා සටන් කරනු! යුද යන්ත්‍රය නවතනු!**

**කම්කරු පන්තියේ ස්වාධීන බලය ගොඩ නගනු!**

**IMF කප්පාදු එපා! සියලු විදෙස් ණය අහෝසි කරනු!**

# කියුබාව යටත් කරගැනීම සඳහා එක්සත් ජනපදය කුසගින්න යොදා ගැනීමට උත්සාහ කරන විට එරට සන්නද්ධ ප්‍රකෝප කිරීම ව්‍යර්ථ කරයි

**ඇන්ඩ්‍රියා ලොබෝ** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ (WSWS) 2026 පෙබරවාරි 26 වන දින ‘Cuba repels armed provocation as US tries to starve island into submission’ යන හිසින් පළවූ ඇන්ඩ්‍රියා ලොබෝ විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.

බදාදා කියුබාවේ උතුරු වෙරළට ඔබ්බෙන් වූ සන්නද්ධ ගැටුමකදී, කියුබානු දේශසීමා ආරක්ෂකයින් විසින් ආයුධ, පුපුරණ ද්‍රව්‍ය සමග දැඩි ලෙස සන්නද්ධ වූ කියුබාවෙන් පිටුවහල් කරන ලද පුද්ගලයින්ගෙන් පිරුණු ඇමරිකානු ධජය සහිත වේග බෝට්ටුවක් පලවා හැර තිබේ. එමගින්, මෙම දිවයින යටත් කර ගැනීම සඳහා සාගින්නෙන් පෙළීමේ වොෂින්ටනයේ ව්‍යාපාරය ඊටත් වඩා භයානක හා ප්‍රකෝපකාරී අවධියකට පිවිසෙමින් පවතින බවට වූ බරපතල අනතුරු ඇඟවීමක් කරයි.



කියුබානු දේශසීමා මුර සංචාර නෞකාව [ඡායාරූපය: කියුබාවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය]

කියුබාවේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට අනුව, ෆ්ලොරිඩාවේ ලියාපදිංචි කර ඇති යාත්‍රාවක් වන FL7726SH හඳුනා ගැනීම සඳහා මුර සංචාර බෝට්ටුවක් ඒ වෙත ගමන් කර ඇත. එම යාත්‍රාව විලා ක්ලාරා පළාතේ වෙරළට නාවික සැතපුමක් පමණ දුරින් —කිසිදු පිළිගත හැකි “නාවික දෝෂයක්” නොමැතිව—ක්‍රියාත්මක විය. එම යාත්‍රාවේ සිටි අය වෙඩි තබා කියුබානු අණ දෙන නිලධාරියාට තුවාල සිදු කර ඇත. ආරක්ෂකයින් ආපසු වෙඩි තැබූ අතර, පුද්ගලයින් හතර දෙනෙකු මිය ගිය ගොස් තවත් හය දෙනෙකුට තුවාල සිදු විය.

බලධාරීන් වාර්තා කළේ ප්‍රහාරක රයිෆල්, පිස්තෝල, මොලොටොව් කොක්ටේල් සහ අනෙකුත් අතින් සාදන ලද පුපුරණ ද්‍රව්‍ය, බැලස්ටික් කබා, දුරේක්ෂ දර්ශන සහ කැලෑ සටන් නිල ඇඳුම් ආදී “ත්‍රස්තවාදී අරමුණු සහිතව ආක්‍රමණය කිරීමේ” උත්සාහයකට අනුකූල උපකරණ අල්ලා ගත් බවයි.

මේ දක්වා හඳුනාගෙන ඇති බොහෝ දෙනා එක්සත් ජනපදයේ පදිංචි කියුබානු ජාතිකයන් වේ. සමහරු දැනටමත් කියුබාවේ අතීත ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය පුද්ගලයින්ගේ ජාතික ලැයිස්තුවේ සිටිති. ධවල මන්දිර මූලාශ්‍රයක් උපුටා දක්වන CBS ප්‍රවෘත්ති වලට අනුව, මියගිය අයගෙන් එක් අයෙකු ඇමරිකානු පුරවැසියෙකි. ප්‍රවෘත්ති වාර්තාවලට අනුව, තුවාල ලැබූවන්ගෙන් එක් අයෙකු ඇමරිකානු පුරවැසියෙකු ලෙස ද හඳුනාගෙන ඇත. මෙම බෝට්ටුව සොරකම් කළ එකක් බව වාර්තා වී ඇත. රඳවාගෙන සිටින හත්වන සැකකරු කියුබාව තුළ ප්‍රහාර එල්ල කිරීමට, සන්නද්ධ කණ්ඩායමට පූර්ව සූදානමක් ඇති කිරීම සඳහා තමන් එක්සත් ජනපදයෙන් එවන ලද බව පාපොච්චාරණය කර ඇති බව වාර්තා වේ.

වොෂින්ටනය ඉදිරිපත් කරනු ලබන කිසිදු උපාමාරුවකට මෙම මෙහෙයුමේ මූලික ස්වභාවය වෙනස් කළ නොහැකිය. එය 1960 ගණන්වල සිට CIA සහ අනෙකුත් ආයතන විසින් වගා කර අරමුදල් සපයන ලද කියුබානු පිටුවහල් ත්‍රස්තවාදීන්ගේ සහ එක්සත් ජනපදය පදනම් කරගත් පැරාමිලිටරි කණ්ඩායම්වල දශක ගණනාවක් පැරණි ජාලයන්ගේ නිෂ්පාදනයකි. ට්‍රම්ප් පරිපාලනය කියුබාවේ ආර්ථිකයේ ගෙල සිර කිරීමට, එක්සත් ජනපදය සඳහා දිවයින “ජාතික හදිසි අවස්ථාවක්” ලෙස ප්‍රකාශයට පත් කිරීමට සහ දණ්ඩනීය තීරුබදු වලින් තෙල් අලෙවි කරන ඕනෑම රටකට තර්ජනය කිරීමට විවෘතව පියවර ගෙන ඇති තත්වයන් යටතේ මෙම ජාල දැන් සක්‍රීය වෙමින් පවතී.

ධවල මන්දිරය මෙම විශේෂිත මෙහෙයුමට සෘජුවම නියෝග කළත් නැතත්, ප්‍රහාරකයන්ගේ ඥාතීන් සහ මිතුරන් යුනිවිෂන් මාධ්‍යවේදී ජේවියර් ඩියාස්ට පුරසාරම් දෙඩූ පරිදි, දකුණු ෆ්ලොරිඩාවේ ගොවිපලක පුහුණුව ලත් ටික්ටොක් හරහා සාමාජිකයින් බඳවා ගත් දැඩි ලෙස සන්නද්ධ වූ මෙම කල්ලිය, ෆ්ලොරිඩාවේ සිට දියත් කර කියුබානු මුහුදු සීමාවට ඇතුළු වූයේ එක්සත් ජනපද බුද්ධි අංශ සහ නීතිය ක්‍රියාත්මක කරන්නන්ගේ අවධානයට ලක් නොවී බව සිතාගත නොහැකිය.

අවම වශයෙන්, මෙම ප්‍රකෝප කිරීම සඳහා එක්සත් ජනපද බලධාරීන්ගෙන් කොළ එළියක් ලැබුණි.

ඇමරිකානු නිලධාරීන්ගේ කුහකකම මවිතකරවන සුළුය. වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝ සහ ඔහුගේ බිරිඳ පැහැර ගැනීමට සහ කියුබාවට එරෙහි ඉන්ධන අවහිරය දැඩි කිරීමට මාස ගණනක් තිස්සේ සහාය දුන් රාජ්‍ය ලේකම් මාර්කෝ රුබියෝ, නිගමනවලට එළඹීමට පෙර “අපට අපගේම තොරතුරු ලැබෙනු ඇත” යනුවෙන් දැන් ප්‍රකාශ කරයි.

ෆ්ලොරිඩාවේ නීතිපති ජේම්ස් උත්මියර්, සිය කෝපය පල කරමින් “ඔබට කියුබානු රජය විශ්වාස කළ නොහැකි” බව පවසන අතර ඊට “මෙම කොමියුනිස්ට්වාදීන් වගකිව යුතු බවට” පත් කරන බවට සපථ කරයි. සෙනෙට් සභික රික් ස්කොට් “කොමියුනිස්ට් කියුබානු පාලනය වගවීමට ලක් කළ යුතු” බව කියා සිටියේය.

ආක්‍රමණිකයන් වින්දිතයින් ලෙස ඉදිරිපත් කර ඇති අතර, සන්නද්ධ ප්‍රහාරයක් වළක්වා ගන්නා අය සැබෑ අපරාධකරුවන් ලෙස ඉදිරිපත් කර ඇත. ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීම සඳහා ඇමරිකානු මුහුදු සීමාවට ඇතුළු වන, දැඩි ලෙස සන්නද්ධ විදේශීය තුවක්කුකරුවන්ගේ බෝට්ටුවකට එක්සත් ජනපද ජාතික ආරක්ෂක සංවිධානයේ ප්‍රතිචාරය කුමක් වනු ඇත්දැයි සැකයක් තිබේද?

“විවෘත මුහුදේ එවැනි වෙඩි හුවමාරු දැකීම අතිශයින් අසාමාන්‍ය දෙයක්” යැයි ප්‍රකාශ කිරීමට රුබියෝට හයියක් තිබුණි. මෙය කැරිබියන් සහ පැසිෆික් කලාපයේ–පූර්ව සැලසුම් කළ මිනීමැරීම් ගණයේ ක්‍රියාවන් වන–ධීවර බෝට්ටුවලට බෝම්බ හෙලීමෙන් අවම වශයෙන් සිවිල් වැසියන් 151 දෙනෙකු ඝාතනය වීම ගැන විවෘතව උදම් අනන රජයකින් ලැබුණු ප්‍රකාශයකි.

1898 දී ස්පාඤ්ඤ යටත් විජිත අත්පත් කර ගැනීම සඳහා යුද්ධය සාධාරණීකරණය කර ගැනීමට, හවානාහි දී යූඑස්එස් මේන් (USS Maine) නෞකාව ගිල්වා දැමීම දඩමීමා කරගත් සහ 1961 දී CIA විසින් සන්නද්ධ කළ කියුබානු පිටුවහල්කරුවන්ගේ බේ ඔෆ් පිග්ස් (Bay of Pigs) ආක්‍රමණය සංවිධානය කළ එම පාලක පන්තියම, දැන් තම දිගු කාලීන ආධිපත්‍යය සඳහා වන අරමුණ සුරක්ෂිත කර ගැනීම සඳහා කැරිබියන් දූපත් වල නව ප්‍රකෝප කිරීම් සඳහා අඩිතාලම දමමින් සිටී.

සිද්ධිය වුනු කාලය එහි දේශපාලන අරමුණ අවධාරණය කරයි. එය සිදු වුයේ රුබියෝ කැරිබියානු ප්‍රජා (Caricom) සමුළුවක් සඳහා, ශාන්ත කිට්ස් සහ නෙවිස් හි අගනුවර වන බැසෙටෙරේ වෙත ගමන් කරන අතරතුර ය. එහිදී මදුරෝ පැහැර ගැනීම සහ කියුබාවට එරෙහි ඉන්ධන අවහිර කිරීම සම්බන්ධයෙන් වොෂින්ටනය විවේචනයට ලක් විය. කැරිබියානු රජයන්ට වෙනිසියුලාව සහ කියුබාව යන දෙකම සමඟ දිගුකාලීන වෙළඳ හා දේශපාලන සබඳතා ඇත.

කියුබාවේ පුහුණුව ලත් වෛද්‍යවරයෙකු වන ශාන්ත කිට්ස් සහ නෙවිස් අගමැති ටෙරන්ස් ඩෲ, “අස්ථාවර වූ කියුබාවක් අප සියල්ලන්ම අස්ථාවර කරනු ඇත” යනුවෙන් සෘජුවම අනතුරු ඇඟවීය. එක්සත් ජනපදයෙන් නෙරපා හරින ලද තුන්වන රටවලින් පිටුවහල් කරන ලද අය පිළිගැනීම, කියුබානු වෛද්‍ය දූත මෙහෙවර කණ්ඩායම් ප්‍රතික්ෂේප කිරීම, චීනය සමඟ සබඳතා ලිහිල් කිරීම සහ මුහුදු මට්ටම ඉහළ යාම සහ කුණාටු ඔවුන්ගේ දූපත් විනාශ කරන තත්වයේදී පවා දේශගුණික විපර්යාස පිළිබඳ සීමිත කැපවීම් පවා ට්‍රම්ප් විසින් ඉරා දමා ඇති බව පිළිගැනීම සඳහා කරන ලද ඇමරිකානු ඉල්ලීම් සම්බන්ධයෙන් කැරිබියානු නායකයින් දුක්ගැනවිලි මතු කළහ.

මෙම අතෘප්තියට මුහුණ දුන් රුබියෝ වෙනිසියුලාව සම්බන්ධයෙන් ආරක්ෂක ස්වරයක් අනුගමනය කළේය. ඔහු පැවසුවේ, “අපගේ මෙහෙයුම් සහ වෙනිසියුලාව කෙරෙහි අපගේ ප්‍රතිපත්තිය පිළිබඳව ඔබගෙන් සමහරෙකුට තනි තනිව හැඟුණු ආකාරය නොසලකා,වෙනිසියුලාව සති අටකට පෙර තිබූ තත්වයට වඩා අද වඩා හොඳ තත්වයක පවතී”, යන්නයි. කලාපීය බලශක්තිය සඳහා කැරකස් “අසාමාන්‍ය හවුල්කරුවෙකු” වීමේ අපේක්ෂාව ඔහු ඉස්මතු කළේය.

ඒ සමඟම, වෙනිසියුලානු ඉන්ධන ඇතුළු සීමිත ගෑස් සහ අනෙකුත් තෙල් නිෂ්පාදන පුද්ගලික කියුබානු ආයතන සහ පුද්ගලයින් හට අපනයනය කිරීමට ඉඩ දී, ඉන් කියුබානු රාජ්‍යය පැහැදිලිවම බැහැර කිරීමෙන්, “කියුබානු ජනතාවට සහාය දෙන” බව එක්සත් ජනපද භාණ්ඩාගාරය ව්‍යාජ ලෙස නිවේදනය කළේය.

මෙක්සිකෝවේ ලා ජෝර්නාඩා පුවත්පත මෙම සීමාවන් “ප්‍රායෝගිකව, නැව්ගත කිරීම් සම්බන්ධීකරණය කිරීමට සහ ලබා ගැනීමට හැකියාව ඇති ඕනෑම කියුබානු ආයතනයක් බැහැර කරයි.” යනුවෙන් සඳහන් කරයි. එක්සත් ජනපද කියුබානු විශේෂඥ විලියම් ලියෝග්‍රෑන්ඩේ වොෂින්ටන් පෝස්ට් වෙත පැවසුවේ, කෙසේ වෙතත්, පෞද්ගලික ක්‍රියාකාරීන් “මානුෂීය අර්බුදයේ සැලකිය යුතු වෙනසක් කිරීමට” ප්‍රමාණවත් තෙල් ආනයනය නොකරන බවයි.

සැබෑ අරමුණ පැහැදිලිය: එනම්, පාලන තන්ත්‍ර වෙනසක් (regime change) සඳහා වොෂින්ටනයේ ප්‍රියතම සමාජ පදනම ලෙස ධනපතියන් සහ මධ්‍යම පාන්තික ව්‍යාපාරිකයින් ස්ථරයක් තවදුරටත් වගා කරන අතරතුර පුළුල් ජනගහනය කුසගින්නේ තබා බිය ගැන්වීමයි. එය මොන්රෝ මූලධර්මය (Monroe Doctrine) යටතේ පොතට අනුව කරන පාලන තන්ත්‍ර වෙනස් කිරීමේ මෙහෙයුමකි. අද ප්‍රායෝගිකව “ට්‍රම්ප් මූලධර්මය” ලෙස විවෘතව මෙය හැඳවනු ලැබේ.

වොෂින්ටනය මෙහිදී සාර්ථක වුවහොත් එයින් අදහස් වන්නේ ඇමරිකානු සංගත සහ බැංකු විසින් පාලනය කරනු ලබන වඩාත් ආන්තික අසමානතාවය සහ ලාභ ශ්‍රම කලාප මත ආධිපත්‍යය දරන කොම්ප්‍රදෝරු ප්‍රභූවක් බලයට පත් කිරීමයි. කුප්‍රකට ප්ලැට් සංශෝධනය (Platt Amendment—1901) යටතේ කියුබාවට පනවන ලද යටත් විජිත තත්වයට නැවත ගෙන එනු ඇති මෙම

මෙහෙයුම, ලතින් ඇමරිකාව සහ කැරිබියන් දූපත් සියල්ල මත තම අසීමිත ආධිපත්‍යය පැටවීමට සහ චීනය, ඉරානය, රුසියාව සහ අනෙකුත් ප්‍රතිවාදීන්ට එරෙහිව ලෝක යුද්ධයට සූදානම් වීමට ඇති පුළුල් එක්සත් ජනපද තල්ලුවේ කොටසකි.

1959 සිට, කියුබාව CIA අනුග්‍රහය ලත් ගණන් නැති මෙහෙයුම්වල ඉලක්කයක් වී ඇත: බෝම්බ හෙලීම්, ෆිදෙල් කැස්ත්‍රෝට එරෙහිව ඝාතන උත්සාහයන්, ආර්ථික කඩාකප්පල් කිරීම්, පිටුවහල් ත්‍රස්ත කණ්ඩායම්වලට ආයුධ සැපයීම සහ අරමුදල් සැපයීම සහ Bay of Pigs ආක්‍රමණය ආදියයි ඒ.

බදාදා මරා දැමූ සහ අල්ලා ගන්නා ලද මිනිසුන් මෙම ඉතිහාසයට හරියටම ගැලපේ: ඔවුහු කියුබානු රජයට එරෙහිව ප්‍රචණ්ඩකාරී විරෝධයක් දැරීම පිළිබඳ ප්‍රචලිත වාර්තා සහිත එක්සත් ජනපදයේ දිගු කාලීන පදිංචිකරුවන් වන අතර එක්සත් ජනපද භූමියේ පුහුණුව ලබා, පැරාමිලිටරි ක්‍රියාමාර්ග හරහා දිවයින "නිදහස් කිරීමේ" නාමයෙන් විවෘතව (මෙම අවස්ථාවේදී සමාජ මාධ්‍ය හරහා) සංවිධානය වී ඇත.

කියුබානු ජනතාව වොෂින්ටනය විසින් සැලසුම් කරන ලද පෙර නොවූ විරූ මානුෂීය ව්‍යසනයකට මුහුණ දෙමින් සිටියදී මෙම ත්‍රස්තවාදී ප්‍රකෝප කිරීම දිග හැරුණි. ට්‍රම්ප්ගේ ජනවාරි 29 වන දින නියෝගය මගින් දිවයිනට ලැබෙන සියලුම බලශක්ති සැපයුම් නැවැත්වීම සඳහා එක්සත් ජනපද අවහිරයක් (US blockade), එනම් යුද ක්‍රියාවක් පනවා ඇත.

ඉන්ධන හිඟය නිසා බොහෝ ප්‍රදේශවලට පැය 20-30 ක විදුලි බිඳවැටීම් ඇති වී ඇති අතර, පොදු ප්‍රවාහන හා ආහාර බෙදා හැරීම අඩාල වී ඇත. ශීතකරණ හා ජල පද්ධති කඩා වැටී ඇත. ඖෂධ හිඟය, මන්දපෝෂණය වර්ධනය වෙමින් පවතින අතර දරුවෝ කුසගින්නේ නින්දට යති. මෙය කියුබාවේ ඉතිරි මිලියන 8 ක ජනතාවක් කුසගින්නේ තැබීමෙන්, එක්සත් ජනපදය විසින් නියම කරන ලද දේශපාලන සමර්ථයක් පිළිගැනීමට සැලසුම් කළ උත්සාහයකි.

මෙම ව්‍යසනය සඳහා මූලික වගකීම එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට පැවරෙන බව පැහැදිලිවම කිව යුතුය. නමුත් කියුබානු පාලන තන්ත්‍රය සමාජවාදය හෝ ධනවාදයට විකල්පයක් නියෝජනය කරන බව එයින් අදහස් නොවේ. 1959 කියුබානු විප්ලවයේ ආරම්භයේ සිටම, ෆිදෙල් කැස්ත්‍රෝ ඇමරිකානු ධනවාදය සමඟ සහයෝගීතාවයක් සෙවූ ධනේශ්වර ජාතිකවාදියෙකි. බලයට පත්වී මාස හතරකට පසු ඔහු මෙසේ ප්‍රකාශ කළේය:

“අපි කොමියුනිස්ට්වාදීන් නොවන බව මම පැහැදිලිව සහ නිශ්චිතව ප්‍රකාශ කර ඇත්තෙමි. කියුබාවේ කර්මාන්ත සංවර්ධනයට දායක වන පෞද්ගලික ආයෝජන සඳහා දොරටු විවෘතව පවතී. එක්සත් ජනපදය සමඟ අවබෝධයකට එළඹෙන්නේ නැත්නම් අපට ප්‍රගතියක් ලබා ගැනීම කිසිසේත්ම කළ නොහැක්කකි.”

වොෂින්ටනය සීමිත ප්‍රතිසංස්කරණ පවා ප්‍රතික්ෂේප කළ විට පමණක්, කැස්ත්‍රෝ ජනසතු කිරීම් වෙත යොමු වී මොස්කව් ස්ටැලින්වාදී නිලධරයෙන් වෙත යොමුවී ආධාර පැතූ අතර, ඒ කියුබාව ක්‍රෙම්ලිනයේ විදේශ ප්‍රතිපත්තියට ගැටගැසීමට සහ දිවයිනේ ස්වාධීන කම්කරු පන්ති දේශපාලනය මර්දනය කිරීමට හිලව් වශයෙනි. සෝවියට් සංගමය විසුරුවා හැරීමෙන් පසු, කියුබානු නායකත්වය ඊට ප්‍රතිචාර දැක්වූයේ රට විදේශ ප්‍රාග්ධනයට වඩ වඩාත් පුළුල් ලෙස විවෘත කිරීමෙනි.

ඇමරිකානු සම්බාධක මගින් නිර්මාණය කරන ලද දරුණු අර්බුදය මෙම ප්‍රභූවේ කොටස් විසින් දකින්නේ තර්ජනයක් ලෙස නොව, පූර්ණ පරිමාණයේ “කම්පන චිකිත්සාව” (shock therapy) ක්‍රියාත්මක කිරීමට සහ ඇමරිකානු පිළිවෙළ යටතේ තරඟකාරී හවුල්කරුවන් ලෙස ඒකාබද්ධ වීමට හැකි අවස්ථාවක් ඉදිරියට ගැනීමක් ලෙසය.

ලෝක සමාජවාදී වෙබ් අඩවිය කියුබාවට එරෙහි සියලු ඇමරිකානු ආක්‍රමණශීලී ක්‍රියාවන්ට කොන්දේසි විරහිතව විරුද්ධ වන අතර, එය මිනීමරු සම්බාධක, ත්‍රස්තවාදී ඇතුළුවීම සහ වර්තමාන සාගත ව්‍යාපාරය දක්වා ක්‍රියා හෙළා දකී. නමුත් අපි එසේ කරන්නේ කියුබානු ධනේශ්වර රාජ්‍යය ආරක්ෂා කිරීම සඳහා නොව ජාත්‍යන්තර කම්කරු පන්තියේ දෘෂ්ටි කෝණයෙන් ය.

කම්කරුවන්ට සහ තරුණයින්ට එරෙහිව මර්දනය තීව්‍ර කිරීම සඳහා මෙම ප්‍රකෝප කිරීම ගසාකෑමට හවානා පාලන තන්ත්‍රය දරන ඕනෑම උත්සාහයකට ද විරුද්ධ විය යුතුය. අධිරාජ්‍යවාදයට එරෙහිව කියුබාව ආරක්ෂා කිරීම, ධනේශ්වර සූරාකෑමට එරෙහිව සටන් කිරීම සහ කැස්ත්‍රෝවාදී බලධාරීන්ගෙන් ස්වාධීනව කම්කරු පන්තිය බලමුලු ගැන්වීම වෙන් කළ නොහැකි කාර්යයන් වේ.

ඉදිරි මාවත පවතින්නේ කියුබාවේ කම්කරුවන්ගේ අරගල එක්සත් ජනපදය, කැරිබියන් සහ ලොව පුරා අරගල සමඟ ඒකාබද්ධ කිරීමෙනි. WSWS විසින් මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද සම්මුඛ සාකච්ඡාවකදී, කියුබානු කම්කරුවෙක් හා මටන්සාස් හි තනි මවක් කුසගින්න සහ බිය මධ්‍යයේ ගෙවන ජීවිතය විස්තර කළ අතර සම්බාධකවලට එරෙහිව ක්‍රියාත්මක වන ලෙස ඇමරිකානු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටියාය.

එම ඉදිරිදර්ශනය සවිඥානික වැඩසටහනක් බවට පත් කළ යුතුය: එක්සත් ජනපදයේ සහ ජාත්‍යන්තරව නැව් තටාක සේවකයින්, ප්‍රවාහන සේවකයින්, තෙල් සේවකයින් සහ අනෙකුත් අයට නිෂ්පාදන හා බෙදාහැරීමේ ලීවරයන්හි ඔවුන්ගේ ස්ථානය භාවිතා කර වටලෑම (siege) බිඳ දැමිය හැකිය; එමගින් සම්බාධක ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරමින් සහ ඉන්ධන, ආහාර සහ ඖෂධ නැව්ගත කිරීම් සංවිධානය කළ හැකිය.

ඒ සමඟම, ජනාධිපතිවරුන් පැහැරගෙන යන, ධීවරයින්ට බෝම්බ

හෙලන සහ විදේශයන්හි මිලියන ගණනක් කුසගින්නේ තබන පාලන තන්ත්‍රය, තමන්ගේ රැකියා, වැටුප් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එරෙහිව රට තුළ යුද්ධ කරන පාලන තන්ත්‍රයම බව ඇමරිකානු කම්කරුවන් හඳුනාගත යුතුය. යුද්ධයට සහ අධිරාජ්‍යවාදයට එරෙහි සටන, එක්සත් ජනපදය තුළම සමාජ අසමානතාවය, යුද්ධය, ෆැසිස්ට්වාදය සහ ධනේශ්වර සූරාකෑමට එරෙහි අරගලයෙන් වෙන් කළ නොහැකිය.

---

ඉංග්‍රීසි බසින් 2026 මාර්තු 7 වන දින ද වෙබ් අඩවියේ පළ කෙරුණි. ලිපි මාලාවේ 1 හා 2 කොටස් The Socialist සඟරාවේ 2025 නොවැම්බර් කලාපයේද, 3 කොටස සඟරාවේ 2026 පෙබරවාරි කලාපයෙ ද පළ කෙරුණි.

**ජෙන්-Z කැරලිවල පෙළපත: අරාබි වසන්තය, වෝල් වීදිය වඩිලෑම සහ කහ කබා උද්ඝෝෂණ—දේශපාලනය, උපායමාර්ග, වැඩ පිළිවෙළ සහ කම්කරු පන්තිය සඳහා පාඩම්** (පෙර ලිපියෙන්)

ඉවසා සිටිනු ඇත්තේ අපහසුතාවයට පත් වන අවස්ථාව දක්වා පමණි, එම අවස්ථාව පැමිණි කල සම්බන්ධීකරණය කරන ලද ෆෙඩරල් රජයේ නියෝග මත එය ඉවත් කරන ලදී.

කහ කබාකරුවන් ආර්ථික වශයෙන් අඩි වශයෙන් වැඩ අඩාල කිරීමේ (distruptive) උපාය මාර්ගවල එකතුවක් වර්ධනය කළහ: භාණ්ඩ සංසරණ ස්ථාන අවහිර කිරීම, සතිපතා රිද්ම දුන් ජාතික බලමුලු ගැන්වීම්, සංකේතාත්මක හා සැලකිය යුතු කඩාකප්පල් කිරීම් වල සංයෝජන ආදිය

# ජෙන්-Z නැගිටීම් සහ නායකත්වයේ අර්බුදය: ‘නායකත්වයක් නොමැති’ ව්‍යාපාර සහ ‘වාම ජනතාවාදයට’ එරෙහිව නොනවතින විප්ලවය – 4 කොටස

**සංජය ජයසේකර** විසිනි.

ජෙන්-*Z* විරෝධතාවල ගෝලීය රැල්ල, විප්ලවවාදී නායකත්වයේ ගැඹුරු වන අර්බුදය සහ ලියොන් ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යායේ පදනම මත සමාජවාදී ජාත්‍යන්තරවාදයේ වැඩපිළිවෙල සඳහා සටන් කිරීමේ අවශ්‍යතාවය විමර්ශනය කරන ලිපි මාලාවක 4 වන සහ අවසාන කොටසෙහි සිංහල පරිවර්තනය අපි මෙහි පළ කරමු. ඉංග්‍රීසි බසින් එය *The Gen-Z Uprisings and the Crisis of Leadership: Permanent Revolution against ‘Leaderless’ movements and ‘Left Populism* යන සිරස යටතේ ප්‍රසිද්ධ කෙරිණි. එහි 1 වන කොටස ඉංග්‍රීසි බසින් 2025 නොවැම්බර් 6 වන දින ද සිංහල බසින් 2025 නොවැම්බර් 10 දින ද *thesocialist.lk* හි ප්‍රකාශයට පත් කරන ලදී. 2 වන කොටස ඉංග්‍රීසි බසින් 2025 නොවැම්බර් 14 වන දින ද සිංහල බසින් 2025 නොවැම්බර් 14 දින ද එහි පළ කෙරුණි. 3 වන කොටස ඉංග්‍රීසි බසින් 2026 පෙබරවාරි 27 වන දින ද සිංහල බසින් 2025 පෙබරවාරි 28 දින ද පළ කෙරුණි. 4 වන කොටස

**උපායමාර්ග: ඍජු ක්‍රියාකාරිත්වය, ඩිජිටල් සංවිධානයවීම සහ විප්ලවවාදී නායකත්වයේ ප්‍රතිස්ථාපනය කළ නොහැකි කාර්යභාරය**

මෙම අරගල මාලා තුන, ඒවා විසින් ඉල්ලා සිටින මූලික දේශපාලන අවශ්‍යතාවන්හි වෙනසක් නොමැතිව, මහජන අරගලයේ වෙනස්වන තාක්ෂණික පරිසරය පිළිබිඹු කරන උපායමාර්ගික (tactical) ආකාරවල ප්‍රගතියක් පෙන්නුම් කරයි.

දේශපාලන පැවැත්මේ ආකාරයක් ලෙස පොදු අවකාශයේ තිරසාර අත්පත් කර ගැනීම සඳහා Occupy පුරෝගාමී වූ අතර, එය තාහ්රීර් චතුරශ්‍රයේ සංකල්පරූපය මත සවිඥානිකව නිර්මාණය කෙරුණි. “ජනතා මයික්‍රෆෝනය (people’s microphone)”, තිරස් තීරණ ගැනීම (horizontal decision-making) සහ රැස්වීම් ප්‍රජාතන්ත්‍රවාදය (assembly democracy), ධනේශ්වර නියෝජිත දේශපාලනයේ දූරස්ථ භාවය ජය ගැනීමේ සැබෑ අභිලාෂයක් ප්‍රකාශ කළේය. නමුත් සංකේතාත්මක වාඩිලෑම ධනේශ්වර නිෂ්පාදනයට හෝ රාජ්‍ය බලයට තර්ජනයක් විය නොහැක. එය

ඒ අතර වේ. ප්‍රංශයේ සටන්කාමී කාර්මික ක්‍රියාමාර්ග සම්ප්‍රදාය, වීදි විරෝධතා පොදු වැඩ වර්ජන බවට පරිවර්තනය කිරීම සඳහා සැබෑ–සාක්ෂාත් කර නොගත් වුවද–හැකියාවන් නිර්මාණය කළේය. උපායමාර්ගික නවෝත්පාදනය තාත්වික විය; දේශපාලන සීමාව එක සමානවම පැවතුණි. ආර්ථිකයේ අංශ සහ කලාප හරහා වැඩ වර්ජන සම්බන්ධීකරණය කළ හැකි ස්වාධීන ක්‍රියාකාරී කමිටු සහ නිවහන් පෙදෙස් කමිටු නොමැතිව, වැඩ අඩාල කිරීමේ ශක්තිය රාජ්‍ය බලයට සැබෑ අභියෝගයක් එල්ල කළ හැකි තිරසාර සංවිධානාත්මක කාර්මික ක්‍රියාමාර්ගයක් බවට පරිවර්තනය කළ නොහැකි විය. වෘත්තීය සමිති නිලධරයෙන් ස්වාධීන වූ එවැනි කමිටු, දේශීය අරගල විප්ලවවාදී ව්‍යාපාරයක් බවට ඔසවා තැබීම සඳහා සංවිධානාත්මක පූර්ව කොන්දේසියයි. [17]

ජෙන්-Z ව්‍යාපාර, සමාජ මාධ්‍ය වේදිකාවල වේගවත් බලමුලු ගැන්වීමේ හැකියාව එකතු කළ අතර, වේගයෙන් විශාල භූගෝලීය ප්‍රදේශ හරහා මහජන ක්‍රියා සම්බන්ධීකරණය කිරීමට හැකියාව ඇති කළේය. එය

සාම්ප්‍රදායික ආයතනික ප්‍රතිචාර මන්දගාමී බව පෙනෙන්නට සැලැස්වීය. මෙම ඩිජිටල් මානය නව හැකියාවන් සහ නව අවදානම් හඳුන්වා දුන්නේය. වේගවත් බලමුලු ගැන්වීම බල ගැන්වූ එම වේදිකා, රාජ්‍ය නිරීක්ෂණය, බුද්ධි අංශවල විනිවිදීම සහ දේශපාලන අන්තර්ගතයේ ඇල්ගොරිතමය හැසිරවීම (manipulation) ද සක්‍රිය කළේය. වඩාත් මූලික වශයෙන්, දේශපාලන සංවිධානය වෙනුවට සමාජ මාධ්‍ය සම්බන්ධීකරණය ආදේශ කිරීම—වැඩසටහනේ පැහැදිලිකම වෙනුවට වෛරල් හැෂ් ටැග්, න්‍යායාත්මක සංවර්ධනය වෙනුවට ප්‍රවණතා මාතෘකා (trending topics)—එහි ව්‍යුහාත්මක දුර්වලතාවය, ඒවාට තිබෙන බව පෙනී ගිය තාක්ෂණික ශක්තිය මගින් ආවරණය කළ ව්‍යාපාර ඇති කළේය. එකී දුර්වලතාවය නම්: වීදි බලය, කම්කරු පන්තිය එහි තීරණාත්මක සමාජ ලීවරය ක්‍රියාත්මක කරන ආකාරය වූ, තිරසාර කාර්මික ක්‍රියාමාර්ගයක් (industrial action) බවට පරිවර්තනය කිරීමට ඇති නොහැකියාවයි.

සෙයිනෙප් ටුෆෙක්සි (Zeynep Tufekci) සහ පාවුලෝ ගර්බෝඩෝ (Paolo Gerbaudo) වැනි න්‍යායාචාර්යවරුන් විසින් ප්‍රවර්ධනය කරන ලද "නායකත්වයක් නොමැති" රාමුව, ෂන්තාල් මූෆ් ගේ වාම ජනතාවාදයේ ප්‍රතිගාමී න්‍යායට නෑකම් කියන දෘෂ්ටිවාදාත්මක කාර්යභාරයක් ඉටු කරයි. තිරස් රැස්වීම්, සමාජ මාධ්‍ය සම්බන්ධීකරණය, විධිමත් නායකත්වයක් නොමැතිකම වැනි ජාලගත විරෝධතාවල සංවිධානාත්මක ආකාර උත්කර්ෂයට නැංවීමෙන්, මෙම න්‍යායාචාර්යවරුන් වෛෂයිකව දේශපාලන ඌනතාවයක් වන දෙයක් දේශපාලන ගුණධර්මයක් බවට උසස් කරයි. "නායකත්වයක් නොමැති" ව්‍යාපාරවල න්‍යායාචාර්යවරුන් විසින් සමරනු ලබන ස්වයංසිද්ධවාදයට (spontaneism) එරෙහිව ලෙනින්ගේ විශ්ලේෂණය එහි සම්පූර්ණ බලය රඳවා ගනී: ස්වයංසිද්ධ කම්කරු පන්ති කෝපය, කෙතරම් සටන්කාමී වුවත්, සමාජවාදී විඥානය ජනනය නොකරයි; එය විප්ලවවාදී දේශපාලන නායකත්වය සංවිධානය කර මෙහෙයවිය යුතු අමුද්‍රව්‍යය වේ. [18] "නායකත්වයක් නොමැති" දෘෂ්ටිවාදය, ව්‍යාපාරයන් නායකත්වයෙන් නිදහස් නොකරයි; එය සැබවින්ම ක්‍රියාත්මක වන නායකත්වය—එනම් රාජ්‍ය නොවන සංවිධාන අරමුදල් සපයන සම්බන්ධීකාරකවරුන්, ප්‍රතිසංස්කරණවාදී මාර්ගවලට ශක්තිය යොමු කරවන ව්‍යාජ-වාම ශාස්ත්‍රාලිකයන් හෝ අවසානයේ මහජන කැරැල්ලේ දේශපාලන ඵල නෙළා ගන්නා ධනේශ්වර දේශපාලනඥයන්—සඟවයි.

**වැඩපිළිවෙළ: ප්‍රතිසංස්කරණවාදී ක්ෂිතිජය සහ එහි අත්‍යවශ්‍ය අතික්‍රමණය**

මෙම ව්‍යාපාර තුනම, "වැඩපිළිවෙළ පිළිබඳ" සංයුක්ත ඉල්ලීම් සමඟ අව්‍යාජ සහ සුජාත දුක්ගැනවිලි ප්‍රකාශ කළේය. එහෙත්, විප්ලවවාදී නායකත්වයක් නොමැති විට, නිෂ්පාදන මාධ්‍යයන් පාලනය කරන්නේ කවුද සහ ඒ කාගේ අවශ්‍යතා සඳහාද යන මූලික ප්‍රශ්නය ක්‍රමානුකූලව නොසලකා හරින ලද ප්‍රතිසංස්කරණවාදී දේශපාලන ක්ෂිතිජයක් තුළ මෙම ව්‍යාපාර තුනම රැඳී ගත්තේය.

වාඩිලෑමේ ඉල්ලීම් (ආදායම්) යලි බෙදාහැරීම, සමාගම්වල වගවීම සහ ආර්ථික අසමානතාවය අඩු කිරීම මත කේන්ද්‍රගත විය. කහ කබාකරුවන්, අඩු ඉන්ධන බදු, ඉහළ අවම වැටුප්, මහජන සේවා ප්‍රතිෂ්ඨාපනය සහ විවිධ ආකාරයේ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා සිටියහ. ජෙන්-Z ව්‍යාපාර ඉල්ලා සිටියේ, IMF විසින් නියම කරන ලද නිශ්චිත බදු පියවර ඉවත් කර ගැනීම, දූෂණය අවසන් කිරීම සහ රාජ්‍ය නායකයින් පුද්ගල වශයෙන් ඉවත් කිරීම ය. මෙම සියලු ඉල්ලීම් අව්‍යාජ ද්‍රව්‍යමය අවශ්‍යතා ප්‍රකාශ කළේය. කම්කරු පන්තියේ දේශපාලන බලය සඳහා වූ වැඩසටහනක් නොමැති විට, ඒවායින් කිසිවක් ධනේශ්වර පාලනයේ රාමුවෙන් ඔබ්බට යොමු නොවීය.

*For a Left Populism* (Verso, 2018) හි මූෆ් විසින් විස්තාරණය කරන ලද සහ ස්පාඤ්ඤයේ පොඩෙමොස් (Podemos) සහ ප්‍රංශයේ Insoumise විසින් සංවිධානාත්මක ප්‍රකාශනයක් ලබා දුන් න්‍යායික රාමුව මත පදනම්ව, සෑම ව්‍යාපාරයක් තුළම පැවති වාම-ජනතාවාදී ප්‍රවණතා මෙම ඉල්ලීම් "කතිපයාධිකාරයට" එරෙහිව "ජනතාවගේ" අරගලයක් ලෙස රාමුගත කරන ලදී. එය කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සහ සමාජවාදී අත්පත් කර ගැනීමේ ඉදිරිදර්ශනය බැහැර කරමින් ධනේශ්වරයේ කොටස් පන්ති හරහා (cross-class) "ප්‍රගතිශීලී" කණ්ඩායමකට ඇතුළත් කිරීමට හිතාමතාම නිර්මාණය කරන ලද සූත්‍රගත කිරීමකි.

ග්‍රීසියේ සිරිසා (Syriza) සහ පොඩෙමොස් අත්දැකීම් පිළිබඳ පුළුල් ආවරණයක් හරහා WSWS මෙම රාමුවේ බංකොලොත්භාවය විශ්ලේෂණය කළේය. 2015 ජනවාරි මැතිවරණ ජයග්‍රහණයෙන් මාස කිහිපයක් ඇතුළත සිරිසා, EU-IMF(යුරෝපා සංගමය-ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) ත්‍රිත්වයට (එනම්, EC-යුරෝපීය කොමිසම, ECB-යුරෝපීය මහ බැංකුව, IMF-ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) යටත් වීම සහ තමන් විරුද්ධ වීමට පොරොන්දු වූ කප්පාදුම ක්‍රියාත්මක කිරීම සඳහා පොඩෙමොස්, PSOE සමඟ සභාග රජයට ඇතුළු වීම[20], වාම-ජනතාවාදය සඳහා ව්‍යතිරේකයක් නොව එහි වඩාත්ම පරිපූර්ණ ප්‍රකාශනයන් වේ. ඉතිහාසය එහි තීන්දුව ලබා දී ඇත: සිරිසාවේ 2015 පාවාදීමෙන් වසර දහයකට පසුව, ග්‍රීසිය තවමත් තීව්‍ර සූරාකෑම සමඟ දරිද්‍රතාවයේ ගිලී සිටී; පොඩෙමොස් රජයට ඇතුළු වී වසර හතරකට පසු, අන්ත දක්ෂිනාංශික වොක්ස් (Vox) පක්ෂය ස්පාඤ්ඤ දේශපාලනයේ ප්‍රධාන බලවේගයක් ලෙස මතු වී ඇත. සමාජවාදයට යාමට පෙර කම්කරුවන් මෙම පක්ෂවල "අත්දැකීම් හරහා යා යුතු" බවට වන ව්‍යාජ-වාම ප්‍රකාශය, කම්කරු පන්තියට විනාශකාරී ප්‍රතිවිපාක ගෙන දී ඇති මාරාන්තික බොරුවක් ලෙස හෙළිදරව් වී ඇත. [21]

සැබවින්ම විප්ලවවාදී ක්‍රියාමාර්ගය වන්නේ නොනවතින විප්ලවයේ

ක්‍රියාමාර්ගයයි—අධිරාජ්‍යවාදී යුගයේ කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවලට අනුරූප වන එකම ක්‍රියාමාර්ගය එයයි. කම්කරු පන්තිය විසින් රාජ්‍ය බලය අත්පත් කර ගැනීමෙන්, ධනේශ්වර පන්තිය අස්වාමික කිරීමෙන් සහ ජාතික දේශසීමා ඉක්මවා සමාජවාදී විප්ලවය ව්‍යාප්ත කිරීමෙන් තොරව කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී කාර්යයක්, කම්කරු පන්තියේ ද්‍රව්‍යමය තත්වයන්හි මූලික දියුණුවක් කල් පවතින පදනමක් මත සුරක්ෂිත කළ නොහැක. Occupy, Yellow Vests සහ Gen-Z ව්‍යාපාරවල පාර්ශ්වීය ඉල්ලීම්, සංක්‍රමණ ඉල්ලීම්—මහජන බලමුලු ගැන්වීම සඳහා ආරම්භක ලක්ෂ්‍ය—ලෙස සේවය කළ හැකිය. ඒ, ICFI හි පදනම් වැඩ පිළිවෙළ පිළිබඳ ලේඛනවල විස්තර කර ඇති පරිදි, ධනවාදය තම සතුරා ලෙස හඳුනා ගන්නා සහ කේන්ද්‍රයේ කම්කරු බලය පිළිබඳ ප්‍රශ්නය මතු කරන වැඩ පිළිවෙළ රාමුවකට ඒවා ඇතුළත් කර ඇත්නම් පමණි. [22]

**සැලකිල්ලට යොමුවන වෙනස්කම්: සමාජ සංයුතිය, භූගෝලය සහ විප්ලවීය තීව්‍රතාවය**

අරගල මාලා ත්‍රිත්වයෙහි මූලික දේශපාලන සමජාතීයභාවය—ඒවායේ පොදු දෘෂ්ටිවාදාත්මක සීමාවන් සහ වැඩ පිළිවෙළ පිළිබඳ ඌනතාවයන්—ස්ථාපිත කිරීමෙන් පසු, මූලෝපායික ඇඟවුම් ගෙන දෙන වෙනස්කම් සඳහන් කර ගැනීම අවශ්‍ය වේ.

**සමාජ සංයුතිය**: වාඩිලෑම තුළ ආධිපත්‍යය දැරුවේ නාගරික, බොහෝ විට උගත්, නාගරික මධ්‍යස්ථානවල සංකේන්ද්‍රණය වූ අඩමාන මධ්‍යම පන්තියේ ස්ථර විසිනි. එය සැබෑ මහජන අතෘප්තිය පිළිබිඹු කළ නමුත් එය සංවිධානය කර මෙහෙයවනු ලැබුවේ පුළුල් "99%" ඇතුළත සමාජීය වශයෙන් වරප්‍රසාද ලත් ස්ථර විසිනි. "සියයට 99" යන සටන් පාඨය කම්කරු පන්තිය සහ තම පන්ති අවශ්‍යතා කම්කරුවන්ගේ අවශ්‍යතාවලින් තියුණු ලෙස වෙනස් වූ ඉහළ මධ්‍යම පන්ති ස්ථරයන් අතර එම සියයට 99 තුළ පැවති බෙදීම් ඉවත් කළේය. කහ කබාකරුවන් භූගෝලීය වශයෙන් සහ සමාජීය වශයෙන් පුළුල් පදනමක්—පළාත්බද කම්කරුවන්, මගීන්, විශ්‍රාමිකයන්, කුඩා ව්‍යාපාර හිමිකරුවන්—නාගරික සමාජ පරිසරයෙන් පිටත සැබෑ කම්කරු පන්තියේ ගැඹුරට ළඟා විය. ජෙන්-Z ව්‍යාපාර, වාඩිලෑම හෝ කහ කබාකරුවන් අත්පත් කර නොගත් පරිමාණයකින් සැබෑ කම්කරු පන්ති සහභාගීත්වයක් සමඟ ශිෂ්‍ය සහ තරුණ පෙරටුගාමීන් ඒකාබද්ධ කළේය: ශ්‍රී ලංකාවේ මහා වැඩවර්ජන, කෙන්යාවේ අනුප්‍රාප්තික වැඩවර්ජන රැල්ල සහ වෘත්තීය සමිති-නිලධාරිවාදී ප්‍රතිබලමුලු ගැන්වීම නොතකා බංග්ලාදේශයේ ඇඟලුම් කම්කරු සහභාගීත්වය, ගුණාත්මකව ඉහළ තලයක අව්‍යාජ කම්කරු පන්ති සටන්කාමීත්වය ප්‍රකාශ කළේය.

**භූගෝලය සහ නව යටත් විජිත මානය:** වාඩිලෑම සහ කහ කබා අධිරාජ්‍යවාදී රටවල—පිළිවෙලින් එක්සත් ජනපදය සහ ප්‍රංශය—සිදු වූ අතර, එහිදී ක්ෂණික දේශපාලන ඉල්ලීම්වලට IMF ණය වහල් භාවය පෙරලා දැමීම හෝ නව යටත් විජිත සූරාකෑමෙන් නිදහස් වීම ඇතුළත් නොවීය. ජෙන්-Z ව්‍යාපාර අතිමහත් ලෙස සිදු වූයේ මෙම මානය කේන්ද්‍රීය වන පැරණි යටත් විජිත සහ අර්ධ යටත් විජිත රටවල ය: IMF, මහජන විරෝධතා අවුලුවාලූ නිශ්චිත බදු පියවර සහ කප්පාදු වැඩසටහන්වල සෘජුව පිටුපස සිටින අතර අධිරාජ්‍යවාදී ආධිපත්‍යය පිළිබඳ ප්‍රශ්නය දේශීය ධනේශ්වර සූරාකෑම පිළිබඳ ප්‍රශ්නයෙන් වෙන් කළ නොහැකි ය. මෙය ජෙන්-Z ව්‍යාපාරවලට, ජාතික ප්‍රජාතන්ත්‍රවාදී දුක්ගැනවිලි සෘජුවම ජාත්‍යන්තර සමාජවාදී විප්ලවය හා සම්බන්ධ කරන මානයක් එක් කරන්නේ, ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය එහි විසිඑක්වන සියවසේ යෙදුමෙන් සනාථ කරමිණි.

**විප්ලවීය තීව්‍රතාවය:** පාලන තන්ත්‍ර වෙනසක් හෝ රාජ්‍ය බලයේ බරපතල බිඳීමක් කිසි විටෙකත් කිරීමට බලයක් නොවුණු, වාඩිලෑම කලලරූපී ස්වරූපයෙදීම මර්දනය කරන ලදී. කහ කබාකරුවන් ප්‍රංශ පාලක පන්තිය තිරසාර පීඩනයකට ලක් කළ නමුත් එහි දේශපාලන ආයතනවල මූලික ස්ථාවරත්වයට තර්ජනයක් නොකළේය. ජෙන්-Z ව්‍යාපාර, ඊට වෙනස්ව, රාජ්‍ය නායකයින් තනතුරුවලින් පලවා හැර, ආණ්ඩු බිඳවැටීමට බල කළ අතර, ශ්‍රී ලංකාවේ ධනේශ්වර පාලනයේ සමස්ත ව්‍යුහයම සොලවාලීමේ විභවය පෙන්නුම් කළ මහා වැඩවර්ජන ගාමකයක් ජනනය කළේය. මෙම උග්‍ර වූ විප්ලවීය තීව්‍රතාවය ට්‍රොට්ස්කිවාදී නායකත්වයක් නොමැතිකම එහි ප්‍රතිවිපාක මගින් වඩාත් විනාශකාරී කරයි. වෛෂයික විප්ලවවාදී තත්වය සහ බලය ලබා ගැනීම සඳහා කම්කරු පන්තිය සතු ආත්මීය ධාරිතාව අතර පරතරය—ජාත්‍යන්තර කමිටුව නිරන්තරයෙන් විප්ලවවාදී නායකත්වයේ අර්බුදය ලෙස හඳුනාගෙන ඇති දෙය—ජෙන්-Z අත්දැකීම තුළ විශේෂ තියුණු බවකින් ප්‍රකාශ වේ.

**ව්‍යාජ වම: ප්‍රාදේශීය අහඹුවන්ගේ සමූහයක් නොව, ජාත්‍යන්තර දේශපාලන ධාරාවක්**

අරගල මාලා තුන පිළිබඳ ඕනෑම බැරෑරුම් විශ්ලේෂණයක්, ව්‍යාජ-වාම සංවිධානවල භූමිකාවට අභිමුඛ විය යුත්තේ, ඒවා දේශීයව විශේෂිත වූ දේශපාලන උගුල් වල එකතුවක් ලෙස නොව—ඒවාට සහභාගිවන්නන්ගේ ආත්මීය අභිප්‍රායන් කුමක් වුවත්—ධනවාදයට පිළිගත හැකි සීමාවන් තුළ කම්කරු පන්තියේ විප්ලවවාදී ශක්තිය සීමා කිරීම යන කාර්යය ඉටු කරන, සුසංයෝගී ජාත්‍යන්තර දේශපාලන ධාරාවක ප්‍රකාශනයක් ලෙස ය.

එක්සත් ජනපදයේ ISO, යුරෝපය පුරා සිරිසා සහ පොඩෙමොස් ව්‍යාපාරයන් ප්‍රවර්ධනය කළ විවිධ පැබ්ලෝවාදී ජාලයන්, කෙන්යාවේ විප්ලවවාදී සමාජවාදී ලීගය, ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය මාක්ස්වාදී-කෙන්යාව, පිලිපීනයේ BAYAN සහ Akbayan, ශ්‍රී ලංකාවේ පෙරටුගාමී සමාජවාදී පක්ෂය (Frontline Socialist Party)—මෙම සංවිධාන ඒවායේ නිශ්චිත ජාතික සන්දර්භයන් නොතකා පොදු දේශපාලන ක්‍රමවේදයක් අන්තර්ගත කර ගනී. න්‍යායික පෙළපත

පැහැදිලිය: ෂොන්ටල් මූෆ්, පොඩෙමොස් සහ මෙලෙන්චොන්ගේ (Mélenchon) ප්‍රංශ Insoumise යන දෙකටම සෘජුවම උපදෙස් දුන්නේය; ඇගේ සහකරු අර්නස්ටෝ ලැක්ලාවිගේ (Ernesto Laclau) පශ්චාත්-මාක්ස්වාදී හෙජමොනි (ආධිපත්‍ය-hegemony) න්‍යාය පිළිබඳ විස්තාරණය මහාද්වීප තුනක් පුරා ව්‍යාජ-වාම කණ්ඩායම්වලට බලපෑම් කර ඇත; ජාත්‍යන්තර සමාජවාදී ප්‍රවණතාවය (International Socialist Tendency) සිරිසාවේ ගමන් පථයට බුද්ධිමය නීත්‍යානුකූලභාවයක් ලබා දුන් අතර එහි යටත් වීම (capitulation) පිළිබඳ මාක්ස්වාදී විවේචන අවහිර කළේය.

ව්‍යාජ-වම විසින් අරගල සීමා කිරීමේ මූලෝපායන් පිළිබඳ විශ්ලේෂණයේ දී WSWS අනතුරු ඇඟවූ පරිදි, මෙම ප්‍රවණතා "'වම' තුළ ධනේශ්වර දෘෂ්ටිවාදය සඳහා සංචිතයක්" ලෙස සේවය කරන අතර, විප්ලවවාදී ක්‍රියාමාර්ගයට නොව, වෘත්තීය සමිති නිලධරය සහ සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී සම්මුතීන් ආරක්ෂා කරයි.[15] ඔවුන්ගේ මධ්‍යම පන්තික සංයුතිය, පදනම් සහ ලාභ නොලබන සංවිධාන මත ඔවුන්ගේ ද්‍රව්‍යමය යැපීම, කම්කරු පන්ති විප්ලවවාදී දේශපාලනය ප්‍රතික්ෂේප කිරීම සහ ස්වයංසිද්ධතාවය සහ "නායකත්වය නොමැතිකම" ප්‍රවර්ධනය කිරීම යන සියල්ල අව්‍යාජ සමාජවාදී නායකත්වයේ මතුවීම අවහිර කිරීමේ එකම කර්තව්‍යයට සේවය කරයි. මහජන ව්‍යාපාරවලට සහභාගී වන කම්කරුවන් සහ තරුණයින් මෙම රටාව තේරුම් ගත යුත්තේ අහඹු සිදුවීම් මාලාවක් ලෙස නොව නිශ්චිත පන්ති අවශ්‍යතාවයක ප්‍රකාශනයක් ලෙස ය.

### "අරගලය" පර්යාලෝකනය කිරීම: 2022 ශ්‍රී ලංකාව සහ ජෙන්-Z කැරැල්ලේ ගෝලීය රටාව

2022 අරගලය—අප්‍රේල් සිට ජූලි දක්වා ශ්‍රී ලංකාවේ පැවති මහජන නැගිටීම—මූලික වශයෙන් රාජපක්ෂ පවුලේ දූෂණයට හෝ වැරදි කළමනාකරණයට එරෙහි විරෝධතාවක් නොවූවත්, පාලන තන්ත්‍රයේ අපරාධකාරීත්වය කෙරෙහි මහජන කෝපය අව්‍යාජ හා පුපුරන සුලු විය. ගෝලීය ධනවාදී බිඳවැටීමේ තත්වයන් යටතේ ශ්‍රී ලංකා ධනවාදයේ ආන්තික අර්බුදයේ ප්‍රකාශනය එය විය. දශක ගණනාවක් විදේශ ණය මත යැපීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝගවලට යටත් වීම සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ඔවුන්ගේ විවිධ පාර්ලිමේන්තු සංයෝජන යන සෑම ධනේශ්වර දේශපාලන සැකැස්මකම දැඩි බංකොලොත්භාවය, ඉන්ධන, ඖෂධ සහ මූලික ආහාර ද්‍රව්‍ය රාක්කවලින් අතුරුදහන් වූ සමාජ ව්‍යසනයක් ඇති කර තිබුණි. COVID-19 වසංගතය සහ යුක්රේනය තුළ රුසියාවට එරෙහිව එක්සත් ජනපද-නේටෝ ප්‍රොක්සි යුද්ධය මගින් මුදා හරින ලද ආර්ථික අවහිර කිරීම, විදේශ විනිමය සංචිත බිඳවැටීම වේගවත් කළ අතර රජයට එහි ණය ගෙවීම පැහැර හැරීමට බල කෙරුණි. අප්‍රේල් සහ ජූලි අතර කාලය තුළ, ජනවාර්ගික රේඛා හරහා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් වීදිවලට එක්රොක් වූහ; මෙය දශක හතක් තිස්සේ සිංහල සහ දෙමළ ස්වෝත්තමවාදය මහජනයා බෙදීමේ ප්‍රධාන මෙවලම ලෙස ක්‍රමානුකූලව ගසාකෑ පාලක පන්තියක් සිටින රටක ප්‍රගාඪ දේශපාලන වැදගත්කමක් ඇති කරුණකි. අප්‍රේල් 28 සහ මැයි 6 යන දිනවල මිලියන ගණනක් සහභාගී වූ මහා වැඩවර්ජන දෙකක්, ස්වාධීන සමාජ බලවේගයක් ලෙස ගමන් ගන්නා විට කම්කරු පන්තියේ විභව ශක්තිය ඉතා පැහැදිලි බලයකින් පෙන්නුම් කළේය. රාජපක්ෂ ධුරයෙන් පලවා හැරි අතර 2022 ජූලි 13 වන දින ඔහුට රටින් පලා යාමට සිදුවිය. ඒ මොහොත වන විටත්, කම්කරු නිලධරය අරගලය හුදකලා කර තිබූ අතර කම්කරු පන්තියට නායකත්වයක් නොපැවතිණි.

නැගිටීම ඇති කළ විප්ලවීය අනතුරට සමානුපාතික පැහැදිලිතාවයකින් ව්‍යාජ-වාම සංවිධාන සහ වෘත්තීය සමිති නිලධරයෝ තම කාර්යය තේරුම් ගත්හ. ඔවුන්ගේ තීරණාත්මක කාර්යය වූයේ ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම නොව එය පාලනය කිරීමයි: එනම්, පහළින් පුපුරා යන දැවැන්ත සමාජ ශක්තිය ධනේශ්වර පාලනය ආරක්ෂා කරන දේශපාලන රාමුවකට යොමු කිරීම සහතික කිරීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ව්‍යාජ-වාම සැකැස්ම වන පෙරටුගාමී සමාජවාදී පක්ෂය (FSP), ව්‍යාපාරයේ කේන්ද්‍රීය දේශපාලන අරමුණ ලෙස "අන්තර්කාලීන ආණ්ඩුවක්" සඳහා වූ ඉල්ලීම ප්‍රවර්ධනය කළේය. මෙම ඉල්ලීම, එය ඉදිරියට ගෙන යන අයගේ මුවින් කෙතරම් රැඩිකල් ලෙස ඇසුණත්, එය කම්කරුවන්ගේ බලය සඳහා වූ ඉල්ලීමක් නොව, මහජන පීඩනයේ කොන්දේසි යටතේ, අපකීර්තිමත් පාර්ලිමේන්තු සංස්ථාපිතයේ එක් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට තවත් කොටසකට කරන ආරාධනයක් විය. වෘත්තීය සමිති සම්මේලන මහා වැඩවර්ජන දෙක කැඳවා පාලනය කළේ ඒවා එක් දින ක්‍රියාමාර්ගවලට සීමා කරමින්, ගාලු මුවදොර පිටියේ ව්‍යාපාරයෙන් ප්‍රවේශමෙන් හුදකලා කරමින්, සහ කිසිදු අවස්ථාවක මූලික ධනේශ්වර පිළිවෙළට අභියෝග කළ හැකි ඉල්ලීම්—එනම්, IMF ණය ප්‍රතික්ෂේප කිරීම, කම්කරුවන්ගේ පාලනය යටතේ ආර්ථිකයේ මෙහෙයුම්කාරක මුදුන් ජනසතු කිරීම හෝ කම්කරු පන්ති බලයේ ස්වාධීන අවයව පිහිටුවීම—ඉදිරිපත් නොකරමිනි. ගාලු මුවදොර පිටියේ සංකේන්ද්‍රණය වූ මධ්‍යම පන්තික විරෝධතා බලවේග, ඔවුන්ගේ පැත්තෙන්, වෝල් වීදිය වාඩිලෑමේ ව්‍යාපාරය සහ කහ කබාකරුවන් විසින් සංලක්ෂිත කළ, "දේශපාලනය එපා, නායකත්වයක් නැත" යන රාමුව ශ්‍රී ලංකාවේ තත්වයන් තුළ ප්‍රතිනිෂ්පාදනය කළ අතර, ධනේශ්වර රාජ්‍යයට සහ ව්‍යසනය ඇති කළ අධිරාජ්‍යවාදී ආධිපත්‍යයට වඩා රාජපක්ෂවරුන් වෙත මහජන කෝපය යොමු කළහ. මෙම කාල පරිච්ඡේදය පුරාම ජාත්‍යන්තර කමිටුව නිවැරදිව අනතුරු ඇඟවීය: කම්කරු පන්තියේ විමුක්තිය අත්කර ගැනීම කම්කරුවන්ගේම කර්තව්‍යය වන අතර, අති දැවැන්ත සමාජ ගැටලුවලට පවතින සමාජ පර්යාය තුළ විසඳුමක් නොමැත.

මෙම ඒකාබද්ධ පාවාදීමේ දේශපාලන ප්‍රතිවිපාක, ICFI විශ්ලේෂණය කලින් අනතුරු අඟවා නිශ්චිතව හඳුනාගෙන

තිබූ නොවැළැක්විය හැකි තර්කනයකින් දිග හැරුණි. ව්‍යාජ වම්මුන් සහ වෘත්තීය සමිති නිලධරය විසින් ඉදිරිපත් කරන ලද "අන්තර්කාලීන ආණ්ඩුවේ" රාමුව තුළ කම්කරු පන්තිය දේශපාලනිකව නිරායුධ කර බලමුලු හරණය කිරීමත් සමඟ, පාලක පන්තිය වෙනුවෙන් ක්‍රියා කිරීමට පාර්ලිමේන්තුවට නිදහස ලැබුණි. හය වතාවක් අගමැති ධුරය දැරූ, මූල්‍ය ප්‍රාග්ධනයේ සහ කොම්ප්‍රදෝරු ධනේශ්වරයේ ඓන්ද්‍රීය නියෝජිතයා සහ, ජනාධිපති ධුරය සඳහා එක ඡන්ද කොට්ඨාශයකින්වත් අනුමත නොකළ දේශපාලනඥයෙකු වූ රනිල් වික්‍රමසිංහ 2022 ජූලි 20 වන දින පාර්ලිමේන්තු ඡන්දයෙන් ජනාධිපති ධුරයට පත් කරන ලදී. ඔහුගේ වරම පැහැදිලි වූ අතර එය අපගමනයකින් තොරව ක්‍රියාත්මක කර ඇත: එනම්, IMF හි කප්පාදු වැඩසටහන ක්‍රියාත්මක කිරීම, ධනේශ්වර පිළිවෙළ යථා තත්ත්වයට පත් කිරීම සහ කම්කරු පන්තියේ ප්‍රතිරෝධය මර්දනය කිරීමයි. අත්‍යවශ්‍ය මහජන සේවා පනත වැඩ වර්ජනය කරන කම්කරුවන්ට එරෙහිව ක්‍රියාත්මක විය. IMF කොන්දේසි වන පෞද්ගලීකරණය, ප්‍රතිගාමී බදුකරණය, රාජ්‍ය සේවාවන් කපා හැරීම ක්‍රියාත්මක කරන ලද්දේ කම්කරු අයිතිවාසිකම් ක්‍රමානුකූලව මර්දනය කිරීමේ කොන්දේසි යටතේ ය. ගාලු මුවදොර කඳවුරට පහරදීම, විරෝධතා අපරාධකරණය කිරීම සහ නැගිටීමට නායකත්වය දුන් ක්‍රියාකාරීන්ට ක්‍රමානුකූලව හිංසා කිරීම අනුපිළිවෙලින් අනුගමනය කරන ලදී. මහජනයා විප්ලවීය ස්වරූපයෙන් අත්කර ගත් දෙය–රාජ්‍ය නායකයෙකු ඉවත් කිරීම–ව්‍යාජ-වාම පාවාදීමේ යාන්ත්‍රණය හරහා එහි නිශ්චිත ප්‍රතිවිරුද්ධය බවට පරිවර්තනය විය: එනම්, නැගිටීම මගින් පෙරලා දැමීමට උත්සාහ කළ එම IMF වැඩසටහනේම වඩාත් විනයගරුක සහ වඩාත් අනුකම්පා විරහිත බලාත්මක කරන්නෙකු ස්ථාපනය කිරීම යි. "තීරණාත්මක කාරණය දේශපාලන නායකත්වය පිළිබඳ කාරණයයි" යන්නට සහ අරගලවල ස්වයංසිද්ධතාවයට (spontaneity) පමණක්–ඒවා කොතරම් සටන්කාමී වුවත්–මහජන විප්ලවවාදී ශක්තිය පාලනය කිරීමට සහ හරවා යැවීමට හැකි ධනේශ්වරයේ සහ එහි ව්‍යාජ-වාම සහායකයන්ගේ සංවිධානාත්මක දේශපාලන ධාරිතාව ජයගත නොහැකි බවට ජාත්‍යන්තර කමිටුව කළ



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ ඉල්ලා අස්වීමට පෙර කොළඹ වීදි විරෝධතාකරුවන් පිරී ඉතිරී යයි. (ඡායාරූපය: සකුනා මියසිනාද ගමගේ | asiafoundation.org වෙතින්)

තක්සේරුව අරගලය තහවුරු කළේය.

ශ්‍රී ලාංකික අත්දැකීම මෙම රචනාව පුරා විශ්ලේෂණය කරන ලද ජෙන්-Z නැගිටීම් වල ගෝලීය රටාව සුවිශේෂ පැහැදිලිකමකින් ආලෝකමත් කරන අතර, එය සුසමාදර්ශී (paradigmatic) අවස්ථාව ලෙස පිළිගැනීමට සුදුසුය—එනම්, WSWS විසින් ස්ථාපිත කරන ලද පරිදි, බංග්ලාදේශය, කෙන්යාව, පිලිපීනය සහ වෙනත් තැන්වල පසුව ඇති වූ නැගිටීම් ගලා ආ අච්චුවයි. ගෝලීය රටාවේ සෑම අත්‍යවශ්‍ය අංගයක්ම සංකේන්ද්‍රිත ස්වරූපයෙන් එහි පවතී: IMF ණය වහල්භාවයේ සහ අධිරාජ්‍යවාදී ආධිපත්‍යය විසින් ඇති කරන ලද වෛෂයික අර්බුදය; සමාජ හා වාර්ගික බෙදීම් හරහා තරුණයින් සහ කම්කරුවන්ගේ පුපුරන සුලු මැදිහත්වීම; අර්බුදය විසඳීමට හැකියාව ඇති සමාජ බලවේගය ලෙස කම්කරු පන්තිය හෙළිදරව් කිරීමේදී මහා වැඩ වර්ජන දෙකෙහි තීරණාත්මක කාර්යභාරය; මහජන ව්‍යාපාරය ධනේශ්වර ක්‍රමය ආරක්ෂා කරන "අන්තර්කාලීන ආණ්ඩුවක" රාමුවකට යොමු කිරීම සඳහා ව්‍යාජ-වාම සහ වෘත්තීය සමිති නිලධාරිවාදී බලවේගවල ක්‍රමානුකූල මැදිහත්වීම; ධනේශ්වර දේපළ සබඳතාවලට අභියෝග කළ හැකි ඉල්ලීම් හිතාමතාම මර්දනය කිරීම; සහ නැගිටීම විසින් ප්‍රතික්ෂේප කළ එම IMF වැඩසටහනම ක්‍රියාත්මක කිරීම මූලික කාර්යය කරගත් නව ආණ්ඩුවක් ස්ථාපනය කිරීම. ව්‍යාජ වාම සහ ලිබරල් විවරණ මගින් ප්‍රජාතන්ත්‍රවාදී ස්වයංසිද්ධතාවය ලෙස සමරනු ලබන ගෝල්ෆේස් ව්‍යාපාරයේ "නායකත්වයක් නොමැති" සහ "දේශපාලනයක් නොමැති" ස්වභාවය, ටුෙක්සි, ගර්බෝඩෝ සහ මූෆ් ශාස්ත්‍රීය ලේඛනවල ඉටු කරන දෘෂ්ටිවාදාත්මක කාර්යයම ශ්‍රී ලංකාව තුළ ඉටු කළේය: එය මහජනතාවගේ සැබෑ විප්ලවවාදී ආවේගය සහ එය එහි අවශ්‍ය අවසානයට ගෙන යා හැකි එකම වැඩ පිළිවෙළ පිළිබඳ රාමුව—නොනවතින විප්ලවය, ස්වාධීන කම්කරු පන්තික දේශපාලන බලමුලු ගැන්වීම, ICFI ගොඩනැගීම—අතර සම්බන්ධතාවය බිඳ දැමීය.

එබැවින්, අරගලය විසින් මතු කරන ලද ප්‍රශ්නය—නයිරෝබි සිට ඩකා දක්වා, කොළඹ සිට මැනිලා දක්වා සෑම ජෙන්-Z නැගිටීමක් විසින්ම සමාන හදිසිතාවයකින් මතු කරන ලද ප්‍රශ්නය—ජනතාවට විප්ලවවාදී ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව තිබේද යන්න

නොවේ. 2022 අප්‍රේල් 28 සහ මැයි 6 මහා වැඩවර්ජන දෙක සහ ජූලි 9 වන දින ජනාධිපති මන්දිරයට කඩා වැදීම, එම ප්‍රශ්නයට නිශ්චිත පිළිතුරක් ලබා දුන්නේය. ප්‍රශ්නය වන්නේ කම්කරු පන්තිය සතුව දේශපාලන මෙවලම—එනම්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ කොටසක් ලෙස සංවිධානය වූ සහ ජාත්‍යන්තර සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සඳහා සටන් කරන, නොනවතින විප්ලව න්‍යායෙන් සන්නද්ධ විප්ලවවාදී මාක්ස්වාදී පක්ෂය—තිබෙන්නේ ද යන්නයි. එය නොමැතිව ජනතාවගේ වෛෂයික විප්ලවවාදී ධාරිතාව ව්‍යාජ-වාම පාවාදීමේ මැදිහත්වීම හරහා ක්‍රමානුකූලව එහි ප්‍රතිවිරුද්ධය බවට, එනම් ජනතාව පෙරලා දැමීමට උත්සාහ කළ ධනේශ්වර පිළිවෙලම තහවුරු කිරීම බවටම, පරිවර්තනය වේ.

**පාඩම් සහ මූලෝපායික නිගමන**

වෝල් වීදිය වාඩිලෑම, කහ කබා උද්ඝෝෂණ සහ පසුගාමී රටවල ජෙන්-Z නැගිටීම් පිළිබඳ සංසන්දනාත්මක විශ්ලේෂණය අතිශයින්ම වැදගත් මූලෝපායික නිගමන ගෙන දේ.

1. **පාර්ලිමේන්තුවෙන් පිටත කැරැලි ගැසීම සමාජ පරිවර්තනය සඳහා අත්‍යවශ්‍ය නමුත් මූලික වශයෙන් ප්‍රමාණවත් නොවන කොන්දේසියකි**: මහජන අරගල මාලා තුන හරහාම පාලක පන්තිය පෙන්නුම් කර ඇත්තේ, ස්වයංසිද්ධ වීදි බලය සමාජ බලය බවට පරිවර්තනය කිරීමට කම්කරු පන්තියට දේශපාලන උපකරණ නොමැති නම්, වඩාත් දැවැන්ත හා අධිෂ්ඨානශීලී මහජන නැගිටීම් වලට එරෙහිව පවා එයට නොනැසී පැවතිය හැකි බවයි.

2. **සේවා ස්ථානවල හා අසල්වැසි ප්‍රදේශවල ස්වාධීන කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනැගීම තීරණාත්මක සංවිධානාත්මක ඉදිරි ගමනයි:** එවැනි කමිටුවලට කර්මාන්ත අංශ සහ කලාප හරහා වැඩ වර්ජන සම්බන්ධීකරණය කළ හැකිය, ක්ෂණික ආර්ථික ඉල්ලීම් පුළුල් දේශපාලන අරමුණු සමඟ සම්බන්ධ කළ හැකිය, සහ කම්කරු පන්තිය තම තීරණාත්මක සමාජ උත්තෝලනය (leverage) ක්‍රියාත්මක කරන ඒකාබද්ධ ව්‍යුහයන් නිර්මාණය කළ හැකිය. ICFI විසින් ගොඩනගන ලද ක්‍රියාකාරී කමිටුවල ජාත්‍යන්තර කම්කරු සන්ධානය (IWA-RFC), ජාත්‍යන්තර පරිමාණයෙන් මෙම උපාය මාර්ගයේ සංවිධානාත්මක ප්‍රකාශනය නියෝජනය කරයි.

3. **සියලු ධනේශ්වර පක්ෂ හා කණ්ඩායම් වලින් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය ආරක්ෂා කිරීම හෙට්ටු කළ නොහැක:** මෙහි තේරුම විවෘතව ධනේශ්වර ගැති පක්ෂ ප්‍රතික්ෂේප කිරීම පමණක් නොව, මහජන අතෘප්තිය නැවත ධනේශ්වර කළමනාකරණය වෙත තල්ලු කරන ව්‍යාජ-වාම සංවිධාන දේශපාලනිකව නිරාවරණය කිරීම සහ පරාජය කිරීමයි.

4. **අරගලය ජාත්‍යන්තරීකරණය කිරීම අතිරේක අභිලාෂයක් නොව මූලෝපායික අවශ්‍යතාවයකි:** ජෙන්-Z රැල්ල තුළ රටවල් ගණනාවක් හරහා මහජන කැරැල්ල එකවර පුපුරා යාම මෙන්ම එම රටවල් පුරා එහි පාවාදීමේ පොදු යාන්ත්‍රණයන් ක්‍රියාත්මක වීම පෙන්නුම් කරන්නේ අර්බුදය ගෝලීය බවත් කම්කරු පන්තියේ ප්‍රතිචාරය එලෙසම ගෝලීය විය යුතු බවත්ය. ජාතික පාලක පන්තිවලට කැරලි හුදකලා කිරීමට ඇති හැකියාව බිඳ දැමීම සඳහා විවිධ රටවල ධනවාදයේ ආර්ථික හා දේශපාලන මර්මස්ථාන වලට එකවර පහර දීම සඳහා වැඩ වර්ජන ක්‍රියාමාර්ග සහ ආරක්ෂක පියවර සැලසුම් කළ යුතුය. ජාත්‍යන්තර කමිටුවේ කොටස් ලෙස සංවිධානය වූ අව්‍යාජ ජාත්‍යන්තරවාදී විප්ලවවාදී පක්ෂ ගොඩනැගීම, ජාතික පිපිරීම් ධනේශ්වර පාලනයට ගෝලීය අභියෝගයක් බවට පරිවර්තනය කිරීමේ පූර්ව කොන්දේසියයි.

5. **කම්කරු පන්තිය තුළ සහ විප්ලවවාදී තරුණයින් අතර සමාජවාදී විඥානය සඳහා අරගලය විප්ලවවාදී සාර්ථකත්වය සඳහා පූර්ව කොන්දේසියයි :** ලෙනින් අවධාරනය කළ පරිදි සහ සියවසක් පුරා විප්ලවවාදී අත්දැකීම් සනාථ කර ඇති පරිදි, කම්කරු පන්තියට අවශ්‍ය වන්නේ දේශපාලන නායකත්වයක් නොමැතිකම නොව, දේශපාලන නායකත්වයේ ඉහළම ගුණාත්මකභාවයක්, එනම්, සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂයේ කොටස් ලෙස සංවිධානය වූ, නොනවතින විප්ලවයේ වැඩ පිළිවෙළින් සන්නද්ධ වූ විනයගරුක විප්ලවවාදී පක්ෂය. "නායකත්වයක් නොමැති" දෘෂ්ටිවාදය මහජන ව්‍යාපාර නායකත්වයෙන් නිදහස් නොකරන අතර එය කම්කරු පන්තියේ අවශ්‍යතාවලට සතුරු වන බලවේගයන්ගේ ග්‍රහනයට ඒවා නතු කර දමයි.

වාඩිලෑම, කහ කබා උද්ඝෝෂණ සහ ජෙන්-Z රැල්ල හරහා දිවෙන පොදු හුය පට වන්නේ වෛෂයික පන්ති අතෘප්තිය ගැඹුරු වීම සහ පාලක පන්තියට මර්දනය හෝ සංකේතාත්මක ප්‍රතිසංස්කරණ මගින් වසා දැමිය නොහැකි දේශපාලන අවකාශයන් නැවත නැවතත් විවෘත වීමයි. තීරණාත්මක ඓතිහාසික කර්තව්‍යය වන්නේ මෙම පුනරාවර්තන කැරැල්ල ස්වාධීන කම්කරු පන්ති නායකත්වය යටතේ සංවිධානාත්මක, සවිඥානික සමාජවාදී අරගලයක් බවට පරිවර්තනය කිරීමයි. එම කාර්යය, එනම් සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ලෙස හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීම,

අපගේ කාලයේ වඩාත්ම හදිසි දේශපාලන වගකීමයි. සමාප්තයි.

යොමුව:

[17] World Socialist Web Site, ‘What way forward in the struggle to bring down Macron?’ (5 April 2023) <https://www.wsws.org/en/articles/2023/04/06/pers-a06.html>

[18] Lenin VI, What Is to Be Done? Burning Questions of Our Movement (1902) <https://www.marxists.org/archive/lenin/works/1901/witbd/>

[19] World Socialist Web Site, ‘The capitulation of Syriza and the lessons for the working class’ (23 February 2015) <https://www.wsws.org/en/articles/2015/02/23/pers-f23.html>

[20] World Socialist Web Site, ‘Podemos enters Spanish government: (8 January 2020) “On Tuesday, the Spanish Socialist Party (PSOE) of Prime Minister Pedro Sanchez officially formed a coalition government with the pseudo-left Podemos party, the Spanish ally of Greece’s pro-austerity Syriza (“Coalition of the Radical Left”).” <https://www.wsws.org/en/articles/2020/01/08/pode-j08.html>

[21] World Socialist Web Site, ‘How Syriza’s betrayals strengthened the extreme political right in Greece’ (27 June 2023) <https://www.wsws.org/en/articles/2023/06/27/etlb-j27.html> ; International Committee of the Fourth International, ‘The Political Lessons of Syriza’s Betrayal in Greece’ (13 November 2015) <https://www.wsws.org/en/articles/2015/11/13/icfi-n13.html>

[22] Trotsky L, The Transitional Programme: The Death Agony of Capitalism and the Tasks of the Fourth International (1938) <https://www.marxists.org/archive/trotsky/1938/tp/> ; International Committee of the Fourth International, The Historical and International Foundations of the Socialist Equality Party (Mehring Books 2008) <https://www.wsws.org/en/special/library/foundations-us/00.html>




මාක්ස්වාදය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම
Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI හි සාමාජික වී එය ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**2026 දී සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය.  එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්ථනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/ මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය theSocialist.lk නිති පතා කියවන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය දිනපතා කියවන්න: wsws.org. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

විප්ලවවාදී නායකත්වය ලෙස සසප ගොඩ නගන්න! SLLA හා එක්වන්න!

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න